# බළන්ගොඩ නගර සභාව

## 2022-10-11 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.10.11**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රුමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | රී. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රි | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රිනී | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 12. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රි | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 15. ගරු නාගරික මන්ත්‍රීනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් ඩී.එම්.ජේ.යූ.ධර්මරත්න මයා

**01. පසුගිය සභාවේ 2022-09-13 දිනැති මහා සභා වාර්තාව හා 2022-10-05 දිනැති විශේෂ මහ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව 2022-09-13 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-10-05 දිනැති විශේෂ මහ සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, 2022-09-13 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-10-05 දිනැති විශේෂ මහ සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් 2022-09-13 දින පැවති මහ සභාවේ සභා වාර්තාවේ ගරු සභාපතිතුමාගේ නිවේදන යටතේ තමන් මුදල් කමිටුවේ තීරණය මත කඩ කාමරයක් ලබා දී ඇති බවට සඳහන් කර ඇති අතර, එම තීරණයන් තනි මතයකින් ගත් දෙයක් නොවන බවත්, මුදල් කමිටුව විසින්ම අනුමත කර ඇති බවත්, වැරැද්ද තමන්ට පැහැදිලි කර දුන්නේ නම් තේරුම් ගැනීමට හැකි බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, 2022-09-13 දින මහ සභා වාර්තාවේ කල් දී ඇති ප්‍රශ්න යටතේ 2022 වර්ෂය සඳහා තමන්ට වෙන් වූ රුපියල් ලක්ෂ 10 ක මුදලින් රු.893,500.00 ක් සංවර්ධන කටයුතු සඳහා වියදම් කර ඇති බවට සඳහන්ව ඇති නමුත් එය රු.318,000.00 ක් වශයෙන් සංශෝධනය විය යුතු බව පැවසීය.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා, 2022-09-13 දින මහ සභා වාර්තාවේ 06:01:16 යෝජනාවේ (පිටු අංක 14) තමන් "අනවසර ගොඩනැගිලි සඳහා දඩ මුදලක් අය කරගෙන අනුමැතිය ලබා දීම සඳහා විරුද්ධ වන බව" සඳහන්ව ඇති අතර, එය විරුද්ධත්වයක් නොමැති බවට සංශෝධනය විය යුතු බව පවසන ලදී.

ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව 2022-09-13 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-10-05 දිනැති විශේෂ මහ සභාවේ වාර්තාව ගරු සභාවේ සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- ගරු සභාපතිතුමා නිවේදන වාරය ආරම්භ කරමින් පසුගිය සභාවේ දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ආයුධයක් පෙන් වූ අතර, ඒ සම්බන්ධව ගරු නාගරික මන්ත්‍රීවරුන් කළ ඉල්ලීම හා තමන්ගේ වුවමනාව මත ලේකම්තුමා දැනුවත් කර පොලිස් පැමිණිල්ලක් කළ බව ද එය පළාත් පාලන කොමසාරිස්තුමාට දැනුම් දී වාචික උපදෙසක් ලබා ගත් බව ද ඒ අනුව සභාවේ ජ්‍යෙෂ්ඨත්වය අනුව සභිකයන් වාඩි කිරීමේ ක්‍රමවේදයෙන් බැහැරව ස්ථාන මාරු කිරීමක් කළ බව ද පවසන ලදී.

  **පෙ.ව. 10:08 ට ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

- එමෙන්ම සභාවේ සියලුම සාකච්ඡා පටිගත වන ලෙස හා සභාවම ආවරණය වන පරිදි කැමරා පද්ධතියක් සවි කර ඇති බව පැවසීය.

  **පෙ.ව. 10:11 ට ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

- අසනීප තත්ත්වයන් හේතුවෙන් 2022-10-11 දින මහ සභාවට සහභාගී නොවන බවත්, නිවාඩු අනුමත කර දෙන ලෙසත්, ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් කරන ලද ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදුව නිවාඩු අනුමත කරන ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- බළන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටිය සම්බන්ධයෙන් 2022.09.30 දිනැතිව හා ACLG 06/02/03 අංකය සහිතව පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා විසින් එවන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

  මෙම ලිපියෙහි දිනය 2022-09-30 ලෙස සටහන්ව ඇති නමුත් ලිපිය නගර සභාවට ලැබී ඇත්තේ 2022-10-07 දින බව ද එය පසුගිය සංගීත ප්‍රසංගයන් ගැන සලකා එවන ලද්දක් නොවන බව ද 2022-02-22 දි පවත්වන ලද විශේෂ සභාවේ අංක 03 තීරණය අනුව නගර සභා ක්‍රීඩාංගනය සංගීත ප්‍රසංග සඳහා ලබා දීමට ගත් තීරණය නැවත සමාලෝචනය කිරීම සුදුසු බවට සඳහන්ව ඇති බව ද පවසන ලදී.

- මුගුණමලය, දෙවන පටුමගෙහි මාර්ගයේ පිවිසුම අසල එකී මාර්ගය දෙවන පටුමග යනුවෙන් නම් කොට සියලු දෙනාගේ පහසුව උදෙසා දැන්වීම් පුවරුවක් මඟින් ප්‍රදර්ශනය කරන ලෙස බළන්ගොඩ, මුගුණමලය, දෙවන පටුමග ගම්වාසීන් විසින් කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

  මුගුණමලය, දෙවන පටුමගෙහි මාර්ගයේ පිවිසුම අසල එකී මාර්ගය දෙවන පටුමග යනුවෙන් නම් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා පවසන ලද අතර, ඒ සඳහා සභාවේ එකඟතාවය හිමි විය.

- දොරවෙලකන්ද ප්‍රදේශයේ නිවෙස්වලට යාම සඳහා කුඩා අඩිපාරක් පවතින අතර, එහි ගමන් කිරීම අපහසු බැවින් මීටර් 200 ක් පමණ වන එම අඩි පාර පුළුල් කර දෙන ලෙස දොරවෙල කන්ද

ප්‍රදේශවාසීන්ගේ අත්සනින් යුක්තව ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මෙය ඉතා කාලෝචිත බැවින් හැකි ඉක්මනින් ඉටු කර දෙන ලෙසට ගරු සභාවේ අදහස් ඉදිරිපත් වූ අතර, ඒ අනුව මේ සම්බන්ධව ස්ථානීය පරීක්ෂණයක් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් වැඩ අධිකාරීතුමාට පවසන ලදී.

- මෙගොඩ කිරිදිගල, අනඳමෙත්ගම මාර්ගය පසුගිය වසරේ අලුත්වැඩියා කර කාපට් කළ නමුත් එම මාර්ගයේ අනඳමෙත්ගම ක්‍රීඩා පිටිය අසල සිට ගල්පොත්ත මංසන්ධිය දක්වා ඉදි කරන ලද කොටසේ බොහෝ අඩුපාඩුකම් ඇති බව ද ගල්පොත්ත මංසන්ධියේ ඇති කාණු දෙක කොන්ක්‍රීට් ආවරණ යොදා ආරක්ෂාකාරී ලෙස සකස් කර දෙන ලෙසද ඉල්ලමින් බළන්ගොඩ,රබර්වත්ත,ඩී.එස්.පී. ගුණපාල යන අය විසින් කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

මෙම මාර්ගය සකස් කිරීමේ දී තමන්ගේ නිවසේ බැම්ම පවා කඩා ඉඩ ලබා දුන් අතර, කොන්ක්‍රීට් ආවරණ යොදන ලෙස මාර්ග සංවර්ධන අධිකාරියට දැනුම් දී ඇති නමුත් මුදල් ප්‍රතිපාදන නොමැති බවට ඔවුන් පවසන බව ද ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා පැවසීය.

මේ සම්බන්ධව ස්ථානීය පරීක්ෂාවක් සිදු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් වැඩ අධිකාරීතුමාට පවසන ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් නන්දන කඩය අසල මාර්ගයේ ගැටලුව සම්බන්ධව සභාවේ විමසීමක් කරන ලදී.

මේ සම්බන්ධව වැඩ අධිකාරීතුමාගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කරගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදී.

- බළන්ගොඩ නගර සභා පුස්තකාලයේ පවතින පුරප්පාඩුව වෙනුවෙන් රැකියා අවස්ථාවක් ලබා දෙන ලෙස බළන්ගොඩ, ඕලුගංතොට, නගර සභා පාර, 60/ඒ, ලිපිනයේ එම්.එච්.එස්. කරුණාරත්න යන අය විසින් කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු සභාපතිතුමා මේ සම්බන්ධව අදහස් දක්වමින් පැවසූයේ මේ වන විට කිසිදු බඳවා ගැනීමක් සිදු නොකරන ලෙසට දැනුම් දී ඇති බැවින් අයදුම්පත් ගොනුවට මෙම අයදුම්පත යොමු කරන බවයි.

- ගොවිජන සේවා මධ්‍යස්ථානයේ මායිම් වැට හා ලේඩිස්මිත්වත්ත පාර අයිනේ තිබෙන කොට්ට ගස් කීපය අනතුරුදායක බැවින් මෙම කොට්ට ගස් කීපය කපා ඉවත් කර දෙන ලෙස ඉල්ලමින් බළන්ගොඩ,රාස්සගල පාර,ලේඩිස්මිත්වත්ත ප්‍රදේශයේ ගම්වාසීන් කිහිපදෙනෙකු විසින් කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.
  ගරු සභාපතිතුමා පැවසූයේ මේ සම්බන්ධව ගොවිජන සේවා මධ්‍යස්ථානයට දැනුම් දී ඇති අතර, දෙවන සිහි කැඳවීම සිදු කිරීමට කටයුතු කරන බවයි.

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.**

අද දින ටෙන්ඩර් මිල ගණන් ඉදිරිපත් වී නොමැති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**05. කල් දී ඇති ප්‍රශ්න**

05:01 **ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

05:01:01 සුනන්දාරාම මාවත අවහිර වන සේ ඉදි කළ වැටවල් දෙකක් පිළිබඳව පසුගිය සභා වාරයට ප්‍රදේශවාසීන්ගෙන් පැමිණිලි ලැබී තිබුණි. ඒ සඳහා ගත් ක්‍රියාමාර්ගය කුමක් ද?

අදාල ඉඩම් හිමිකරු යැයි පවසන කාරියවසම් යන අය විසින් සභාවට පැමිණ ඉදිරිපත් කළ කරුණු අනුව එම ඉඩමට කුණු හා අපද්‍රව්‍ය ගෙනවිත් දැමීම නිසා ඇති වු ඩෙංගු අවදානම හේතුවෙන් සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය මඟින් දැන් වූ පරිදි වැට ඉදි කළ බවත් මාර්ගය සඳහා අවශ්‍ය ඉඩ ලබා දිය හැකි බවටත් එකඟ වූ බව ගරු සභාපතිතුමා පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ ඔවුන් පවසන්නේ අසත්‍යයක් වන අතර, මාර්ගය අවහිර වන සේ වැට ඉදි කර ඇති බවත්ය.

මේ සම්බන්ධව සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ගරු සභාපතිතුමා වැඩ අධිකාරීතුමාට පවසන ලදී.

05:01:02 බුලත්ගම,තලාව ගෙදර මාර්ගයට අනතුරුදායක ලෙස පොල් ගෙඩි සහ අතු වැටෙන පොල් ගස පිළිබඳව ප්‍රදේශවාසීන්ගෙන් ලැබුණු පැමිණිලි සඳහා සභාව ගත් ක්‍රියාමාර්ගය කුමක් ද?

ගරු සභාපතිතුමා පැවසූයේ බලපත්‍රය ලබා ගෙන මෙම පොල් ගස ඉවත් කරන ලෙස දැනුම් දී ඇති බවයි.

05:01:03 නාගරික අවන්හල ඉදි කිරීම සම්බන්ධ වර්තමානයේ ප්‍රගතිය කුමක් ද? ඒ සඳහා ක්‍රියා කරන්නේ කුමන ආකාරයට ද?

අදාල සැලසුම් පිටපත් ලබා ගැනීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශය ලබා දී ඇති අතර, මිල ගණන් කැඳවා ඇත.

**05:02 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා**

05:02:01 ඉරිදා පොළ මුර කුටිය ටෙන්ඩර් දීමට නොහැකි බව ගරු සභාපතිතුමා පැවසූ අතර, ඒ බව පවසමින් කොමසාරිස්තුමා විසින් එවන ලද ලිපිය සභාගත කරන්න.

ගරු සභාපතිතුමා පැවසූයේ ඉරිදා පොළ මුර කුටිය ටෙන්ඩර් දීම සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් කරන ලද විමසීමේ දී එතුමා විසින් වාචිකව ලබා දුන් උපදෙස් තමන් සභාවට පැවසූ බවයි.

ඉරිදා පොළ මුර කුටිය ටෙන්ඩර් දීමේ හැකියාව සම්බන්ධව ප්‍රජා සංවර්ධන නිළධාරී ගාමිණී මහතාගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.

අදාල කරුණු පැහැදිලි කරගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

05:02:02 බළන්ගොඩ තානායමේ රට බීම හලෙහි වහල සකස් කිරීමේ වර්තමාන තත්ත්වය කුමක් ද?

අදාල ස්ථානය වැඩ අධිකාරීතුමා විසින් පරීක්ෂා කර ඇති අතර, වහල සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**05:03 ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

05:03:01 බස් නැවතුම්පළ නව පදික කඩ ඉදිරිපිට ත්‍රීරෝද රථ නවතා තැබීම සම්බන්ධයෙන් සභාව ගත් ක්‍රියාමාර්ගය කුමක් ද?

මේ සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් පදික කඩ කාමාර කිහිපයක් වසා තබා ඇති බවට මීට පෙර අවස්ථාවක දී ද තමන් පෙන්වා දුන් නමුත් ඒ සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවයි.

ගරු සභාපතිතුමා පැවසූයේ පදික කඩ දීර්ඝකාලීනව වසා තබා නොමැති නමුත් ඒ සම්බන්ධව වාර්තාවන් දෛනිකව ලබා ගෙන අවශ්‍ය ක්‍රමවේදය අනුගමනය කරන බවයි.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් ඩිජිටල් පුවරුවක් පැවති නිසා එම ස්ථානයේ ඉඩ ප්‍රමාණයක් ඉතිරි කරමින් පදික කඩ ඉදි කළ අතර, ත්‍රිවිල් රථ දෙකක් හෝ තුනක් එම ස්ථානයේ නවතා තබා ඇති බව ද ඉන් කිසිවෙකුට අවහිරයක් සිදු වී නොමැති බැවින් පවතින ආර්ථික තත්ත්වය සලකා එම අයට බාධාවක් නොකර ලංකා බැංකුව ඉදිරිපිට නවතා තිබෙන ත්‍රිවිල් රථ නිසා ඇති වී ඇති වාහන තදබදය වැළැක්වීමට කටයුතු කරන ලෙස පවසන ලදී.

05:03:02 උඩකන්ද පාර කාණු පද්ධතිය සකස් කිරීමේ ප්‍රගතිය කුමක් ද?

පවතින මූල්‍ය තත්ත්වය මත ආරම්භ කිරීමට නොහැකි වී ඇති බව ගරු සභාපතිතුමා පැවසීය.

05:03:03 බස් නැවතුම්පළ ජෑම් ගස ඉදිරියේ ත්‍රිවිලර් නවතා තිබෙන ස්ථානයේ නගර සභාවට අයත් බිම් කොටසේ කඩ කිහිපයක් ඉදි කිරීමට හැකියාවක් ඇත. ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගය කුමක් ද?

මෙම බිම් තීරය නාගරික සංවර්ධන අධිකාරිය සතු බව ගරු සභාපතිතුමා පැවසීය.

**06. කල් දී ඇති යෝජනා**

**06:01 ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා**

06:01:01 පොදු වෙළඳසැල අංක 15 දරණ එළු මස් කඩ කාමරය සඳහා මස් සපයා ගැනීම රත්නපුර දිස්ත්‍රික්කය තුල පිහිටි ගෝ ඝාතකාගාරයකින් සිදු කිරීම හා 2023-01-01 වන දින සිට 2023-12-31 දින දක්වා වූ කාලයක් සඳහා සුදුසු බදුකරුවන් තෝරා ගැනීම වෙනුවෙන් ටෙන්ඩර් කිරීම, අවම ලංසු මුදල තීරණය කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පොදු වෙළඳසැල අංක 15 දරණ එළු මස් කඩ කාමරය සඳහා වර්තමාන මාසික ටෙන්ඩර් මුදල රු. 10,050.00 ක් වන බව පැවසීය.

ඒ අනුව පොදු වෙළඳසැල අංක 15 දරණ එළු මස් කඩ කාමරය සඳහා මස් සපයා ගැනීම රත්නපුර දිස්ත්‍රික්කය තුල පිහිටි ගෝ ඝාතකාගාරයකින් සිදු කිරීම හා වර්තමාන මාසික ටෙන්ඩර් මුදල වන රු. 10,050.00 ක මුදලට 50%ක් වැඩි කර මාසික අවම ලංසු මුදල වශයෙන් රු. 15,075.00 ක මුදල සුදුසු බවට ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:02 පොදු වෙළඳසැල අංක 16 දරණ හරක් මස් කඩ කාමරය සඳහා මස් සපයා ගැනීම රත්නපුර දිස්ත්‍රික්කය තුල පිහිටි ගෝ ඝාතකාගාරයකින් සිදු කිරීම හා 2023-01-01 වන දින සිට 2023-12-31 දින දක්වා වූ කාලයක් සඳහා සුදුසු බදුකරුවන් තෝරා ගැනීම වෙනුවෙන් ටෙන්ඩර් කිරීම, අවම ලංසු මුදල තීරණය කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පොදු වෙළඳසැල අංක 16 දරණ හරක් මස් කඩ කාමරයේ පසුගිය ටෙන්ඩර් මුදල රු. 400,042.00 ක් වන අතර, 2021-12-01 දිනැති RT/RP/1943 දරණ තක්සේරු ලිපිය අනුව තක්සේරු කර ඇති මුදල රු. 400,000.00 ක් බව ද එය 2024.12.01 දින දක්වා වලංගු බව ද පවසන ලදී. එමෙන්ම පසුගිය වර්ෂයක හාලි ඇල සිට මස් ගෙන ඒමේ දී එක් වරක් පමණක් ගෙන ආ නමුත් ඉන්පසුව වෙනත් මාර්ගවලින් ගෙන ආ බවත්, හරක් මස් අලෙවි කිරීමට තමන් අකමැති

නමුත් මුස්ලිම් භක්තිකයන්ගේ ප්‍රධාන ආහාර වේලක් නිසා අකමැත්තෙන් වුව ද එය ඉටු කළ යුතු බවත් රත්නපුර දිස්ත්‍රික්කය තුල පිහිටි ගෝ ඝාතකාගාරයකින් මස් සපයා ගැනීම සිදු කළහොත් මස්වල සෞඛ්‍යාරක්ෂිත බව සොයා බැලීමට හැකියාවක් ඇති බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ රත්නපුර දිස්ත්‍රික්කය තුල සීමිත ගෝ ඝාතකාගාර සංඛ්‍යාවක් පවතින නිසා වෙළඳ ඒකාධිකාරියක් පවතින බැවින් අවම ලංසුව රු.ලක්ෂ 35 ක් දක්වා වැඩිකර විවෘතව ටෙන්ඩර් කිරීම සුදුසු බවයි.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් මස් වෙළෙන්ඳන් අධික ලාභයක් උපයන අතර, අවම ලංසුව වැඩි කර විවෘත ටෙන්ඩරයකට යාම සුදුසු බව ද බල ප්‍රදේශය තුල ඉල්ලුම්පත් නිකුත් කිරීම සිදු කිරීමෙන් විවිධ බලපෑම් තුල සභාවට ලැබෙන ආදායම අඩු වන බව ද පවසන ලදී.

මේ සම්බන්ධව ලේකම්තුමාගෙන් හා ප්‍රජා සංවර්ධන නිළධාරී ගාමිණී වීරසිංහ මහතාගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.

අදාල නීතිමය තත්ත්වයන් මෙන්ම රජයේ තක්සේරු මුදල මත පදනම්ව තීරණ ගැනීම හා මේ සම්බන්ධව අදාල අනිකුත් කරුණු පැහැදිලි කරගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

අනතුරුව පොදු වෙළඳසැල අංක 16 දරණ හරක් මස් කඩ කාමරය සඳහා මස් සපයා ගැනීම රත්නපුර දිස්ත්‍රික්කය තුල පිහිටි ගෝ ඝාතකාගාරයකින් සිදු කිරීම හා වර්තමාන මාසික ටෙන්ඩර් මුදල වන රු. 400,042.00 ක මුදලට 20%ක් වැඩි කර ටෙන්ඩර් කිරීම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

පොදු වෙළඳසැල අංක 16 දරණ හරක් මස් කඩ කාමරය සඳහා මස් සපයා ගැනීම රත්නපුර දිස්ත්‍රික්කය තුල පිහිටි ගෝ ඝාතකාගාරයකින් සිදු කිරීම හා මාසික අවම ලංසු මුදල වශයෙන් රු.750,000.00 ක මුදලට ටෙන්ඩර් කිරීම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සංශෝධිත යෝජනාවක් ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ මේ සම්බන්ධව යෝජනා දෙකක් ඉදිරිපත් වී ඇති බැවින් බෙදීමකට යාමට සිදුවන බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා විසින් පොදු වෙළඳසැල අංක 16 දරණ හරක් මස් කඩ කාමරය සඳහා මස් සපයා ගැනීම රත්නපුර දිස්ත්‍රික්කය තුල පිහිටි ගෝ ඝාතකාගාරයකින් සිදු කිරීම හා වර්තමාන මාසික ටෙන්ඩර් මුදල වන රු. 400,042.00 ක මුදලට 20%ක් වැඩි කර ටෙන්ඩර් කිරීමේ යෝජනාවට පක්ෂ බව හා පොදු වෙළඳසැල අංක 16 දරණ හරක් මස් කඩ කාමරය සඳහා මස් සපයා ගැනීම රත්නපුර දිස්ත්‍රික්කය තුල පිහිටි ගෝ ඝාතකාගාරයකින් සිදු කිරීම හා මාසික අවම ලංසු මුදල වශයෙන් රු.750,000.00 ක මුදලට ටෙන්ඩර් කිරීමේ යෝජනාවට පක්ෂ බව විමසීම

සඳහා බෙදීමක් යෝජනා කරන ලදුව එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රි ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද, රහස් ඡන්දයක්ද යන්න යෝජනා ස්ථිර කර ගන්නා ලෙස ගරු සභාපතිතුමන් විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

එහි දී විවෘත ඡන්දයකට යාම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

මෙහිදී, පොදු වෙළඳසැල අංක 16 දරණ හරක් මස් කඩ කාමරය සඳහා මස් සපයා ගැනීම රත්නපුර දිස්ත්‍රික්කය තුල පිහිටි ගෝ ඝාතකාගාරයකින් සිදු කිරීම හා වර්තමාන මාසික ටෙන්ඩර් මුදල වන රු. 400,042.00 ක මුදලට 20%ක් වැඩි කර ටෙන්ඩර් කිරීමේ යෝජනාවට පක්ෂව සභිකයින් හය දෙනෙකු ද එනම්,

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රුමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එස්. ඒ. ජෝර්ජ් මැතිතුමා ද |

පොදු වෙළඳසැල අංක 16 දරණ හරක් මස් කඩ කාමරය සඳහා මස් සපයා ගැනීම රත්නපුර දිස්ත්‍රික්කය තුල පිහිටි ගෝ ඝාතකාගාරයකින් සිදු කිරීම හා මාසික අවම ලංසු මුදල වශයෙන් රු.750,000.00 ක මුදලට ටෙන්ඩර් කිරීමේ යෝජනාවට පක්ෂව සභිකවරුන් දස දෙනෙකුද එනම්,

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රිනී | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ලාල් ගලප්පත්ති මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්. විමලසිරි මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනී | තරංගනී සමරසේකර මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී. පේමදාස මැතිතුමා ද |

ඡන්දය ප්‍රකාශ කළ අතර, ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා අද දින සභාවට නොපැමිණිනි.

ඒ අනුව පොදු වෙළඳසැල අංක 16 දරණ හරක් මස් කඩ කාමරය සඳහා මස් සපයා ගැනීම රත්නපුර දිස්ත්‍රික්කය තුල පිහිටි ගෝ ඝාතකාගාරයකින් සිදු කිරීම හා වර්තමාන මාසික ටෙන්ඩර් මුදල වන රු. 400,042.00 ක මුදලට 20%ක් වැඩි කර ටෙන්ඩර් කිරීමේ යෝජනාවට පක්ෂව ඡන්ද 06 ක් ද, පොදු වෙළඳසැල අංක 16 දරණ හරක් මස් කඩ කාමරය සඳහා මස් සපයා ගැනීම රත්නපුර දිස්ත්‍රික්කය තුල

පිහිටි ගෝ ඝාතකාගාරයකින් සිදු කිරීම හා මාසික අවම ලංසු මුදල වශයෙන් රු.750,000.00 ක මුදලට ටෙන්ඩර් කිරීමේ යෝජනාවට පක්ෂව ඡන්ද 10 ක් ද වශයෙන් ලැබුණි.

ඒ අනුව වැඩි ඡන්ද 04 කින් පොදු වෙළඳසැල අංක 16 දරණ හරක් මස් කඩ කාමරය සඳහා මස් සපයා ගැනීම රත්නපුර දිස්ත්‍රික්කය තුල පිහිටි ගෝ ඝාතකාගාරයකින් සිදු කිරීම හා මාසික අවම ලංසු මුදල වශයෙන් රු.750,000.00 ක මුදලට ටෙන්ඩර් කිරීමේ යෝජනාව සභා සම්මත විය.

06:01:03 2023-01-01 වන දින සිට 2023-12-31 දින දක්වා වූ කාලයක් සඳහා පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීම වෙනුවෙන් සුදුසු බදුකරුවන් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් කිරීම, අවම ලංසු මුදල තීරණය කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීමේ වර්තමාන මාසික ටෙන්ඩර් මුදල රු. 95,050.00 ක් වන බව පැවසීය.

ඒ අනුව 2023-01-01 වන දින සිට 2023-12-31 දින දක්වා වූ කාලයක් සඳහා පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීමේ වර්තමාන මාසික ටෙන්ඩර් මුදල වන රු.95,050.00 ක මුදල අවම ලංසු මුදල වශයෙන් ගෙන ටෙන්ඩර් කිරීම සුදුසු බවට ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:04 2023-01-01 වන දින සිට 2023-12-31 දින දක්වා වූ කාලයක් සඳහා රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීම වෙනුවෙන් සුදුසු බදුකරුවන් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් කිරීම, අවම ලංසු මුදල තීරණය කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව 2023-01-01 වන දින සිට 2023-12-31 දින දක්වා වූ කාලයක් සඳහා රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීමේ වර්තමාන මාසික ටෙන්ඩර් මුදල වන රු.100,150.00 ක මුදල අවම ලංසු මුදල වශයෙන් ගෙන ටෙන්ඩර් කිරීම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:05 බළන්ගොඩ නගර සභාවේ සැලසුම් කමිටුවට සහභාගී වන කමිටු සාමාජිකයන්ට ගෙවනු ලබන දීමනාව රු. 2,000.00 දක්වා වැඩි කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:06 බළන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටියේ සැණකෙලියක් පැවැත්වීමේ දී ක්‍රීඩා පිටියට යම් කිසි අලාභහානියක් සිදු වුවහොත් පියවා ගැනීම සඳහා රුපියල් ලක්ෂ 25 ක ආපසු ගෙවන තැන්පතු මුදලක් රඳවා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:07 බළන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටියේ සංගීත ප්‍රසංගයක් පැවැත්වීමේ දී ක්‍රීඩා පිටියට යම් කිසි අලාභහානියක් සිදු වුවහොත් පියවා ගැනීම සඳහා රුපියල් ලක්ෂ 05 ක ආපසු ගෙවන තැන්පතු මුදලක් රඳවා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:08 2023 වර්ෂය සඳහා බළන්ගොඩ නගර සභාවේ පහත සඳහන් බදු හා ගාස්තු පැනවීම වෙනුවෙන් ගැසට් නිවේදන පළ කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

**I. 2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම.**

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය හෙවත් 1939 අංක 61 දරණ නගර සභා ආඥා පනතේ 166 වන වගන්තිය යටතේ බළන්ගොඩ නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බළන්ගොඩ නගර සභා සීමාව ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2012 වර්ෂයේදී සිදුකරන ලද තක්සේරුව/ සත්‍යෝක්ෂණය 2023 වර්ෂය සඳහා පාදක කර ගැනීමටත්, එකී තක්සේරුව මත ඉහත කී නගර සභා ආඥා පනතේ 160 වන වගන්තිය ප්‍රකාරව සභාව වෙත පැවරී ඇති බලතල යටතේ බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ ඇතුළත පිහිටියා වූ කිසියම් දේපළක් මත ඉහත කී තක්සේරුව සඳහා නියමකර ඇති වාර්ෂික වටිනාකමින්,

(අ). නේවාසික ස්ථාන සඳහා සියයට හතර (4%)ක වාර්ෂික වරිපනම් බදු අනුප්‍රමාණයමද,

(ආ). වෙළඳ හෝ වාණිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන දේපළයන් මත සියයට පහ (5%)ක වරිපනම් බදු අනුප්‍රමාණයමද, නියමවිය යුතු බවටත්,

තවද, 2023 වර්ෂයේ පහත උප ලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඊට ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද නගර සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස සමස්ත වාර්ෂික වරිපනම් බද්ද 2023 වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහය (10%)ක වට්ටමක්ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල නගර සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් කාර්තුවකට අදාළ මුදලින් සියයට පහ(5%)ක වට්ටමක්ද නගර සභාව විසින් ලබාදිය යුතු වේ.

ඉහත කී උපලේඛනය

| කාර්තුව | ගෙවිය යුතු දිනය | 5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය |
|---|---|---|
| 2023 වර්ෂයේ පළමුවන කාර්තුව | 2023-03-31 | 2023-01-31 |
| 2023 වර්ෂයේ දෙවන කාර්තුව | 2023-06-30 | 2023-04-30 |
| 2023වර්ෂයේ තුන්වන කාර්තුව | 2023-09-30 | 2023-07-31 |
| 2023වර්ෂයේ හතරවන කාර්තුව | 2023-12-31 | 2023-10-31 |

**II. 2023 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම.**

255 වැනි අධිකාරිය වන 1939 අංක 61 දරන නගර සභා ආඥා පනතේ 165 අ(1)(2) වගන්තිවලින් නගර සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර බලංගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ 11 වැනි තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කල යුතු බව හා එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2023 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර නගර සභා කාර්යාලයට ගෙවිය යුතු වේ.

| I වන තීරුව | | II වන තීරුව | | |
|---|---|---|---|---|
| අනු අංකය | කර්මාන්තයේ ස්වභාවය | පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම | | |
| | | රු. 750/= නොයික්මවන අවස්ථාවක | රු. 750/= ඉක්මවන එහෙත් රු. 1,500/= නොයික්මවන අවස්ථාවක | රු. 1,500/= නොඉක්මවන අවස්ථාවක |
| 01 | කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 02 | ස්වර්ණාභරණ නිපදවීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 03 | මැටි භාණ්ඩ නිපදවීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 04 | දුරකථන/ ඡායාපිටපත් යන්ත්‍ර අලුත්වැඩියා කිරීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 05 | මැණික් කැපීම හා ඔප දැමීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 06 | මිනී පෙට්ටි නිපදවීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 07 | වඩු කර්මාන්තශාලා | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 08 | තේ කර්මාන්තශාලා | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 09 | ගමන් මළු නිපදවීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 10 | පාවහන් නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 11 | ගීත/ වීඩියෝ පටිගත කිරීම හෝ තැටිගත කිරීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 12 | පින්තූර රාමු කිරීමේ වැඩපල | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 13 | කොහු නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 14 | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 15 | ඩිජිටල් ප්‍රින්ටින් | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 16 | ඡායා පිටපත් ගැනීමේ ස්ථාන | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 17 | ඇඳුම් මැසීමේ ස්ථාන (ටේලර් ෂොප්) | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 18 | ජංගම දුරකථන අලුත්වැඩියා කිරීමේ ස්ථාන | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 19 | ඉලෙක්ට්‍රොනික් උපකරණ අලුත්වැඩියා කිරීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 20 | නගර සහ උද්‍යාන අලංකරන සැළසුම් සකස්කරනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |

**2023 වර්ෂය සඳහා ව්‍යාපාරික බද්ද පැනවීම.**

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය හෙවත් 1939 අංක 61 දරන නගර සභා ආඥා පනතේ 165 (ආ) වගන්තියෙන් නගර සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී ආඥා පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී ආඥාපනතේ 165 අ වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් බලංගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2023 වර්ෂයේදී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුලත පවත්නා අවස්ථාවක එහි 11 වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීම, බද්දට යටත් සෑම තැනැත්තෙකුම එකී ව්‍යාපාර බද්ද 2023 වර්ෂයේ මාර්තු 31 වැනි දිනට පෙර බලංගොඩ නගර සභා කාර්යාලයට ගෙවිය යුතු වේ.

උපලේඛනය

| I වන තීරුව | II වන තීරුව | |
|---|---|---|
| බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය | ගෙවිය යුතු බද්ද | |
| | රුපියල් | ශත |
| රුපියල් 6,000.00 නොඉක්මවන අවස්ථාවක | - | - |
| රුපියල් 6,000.00 ඉක්මවන එහෙත් රුපියල් 12,000.00 නොයික්මවන අවස්ථාවක | 90 | 00 |
| රුපියල් 12,000.00 ඉක්මවන එහෙත් රුපියල් 18,750.00 නොයික්මවන අවස්ථාවක | 180 | 00 |
| රුපියල් 18,750.00 ඉක්මවන එහෙත් රුපියල් 75,000.00 නොයික්මවන අවස්ථාවක | 360 | 00 |
| රුපියල් 75,000.00 ඉක්මවන එහෙත් රුපියල් 150,000.00 නොයික්මවන අවස්ථාවක | 1,200 | 00 |
| රුපියල් 150,000.00 ඉක්මවන අවස්ථාවක | 3,000 | 00 |

**දෙවන කොටස**

ව්‍යාපාරික බද්දට යටත්වන විෂයයන්

01. ආයුර්වේද බෙහෙත් අලෙවිය
02. ඇස් කණ්ණාඩි අලෙවිකිරීම
03. ඉංග්‍රීසි බෙහෙත් අලෙවිය (ෆාමසි)
04. ඉන්ධන පිරවුම්හල
05. උකස්බඩු ගන්නා ස්ථාන
06. උත්සව භාන්ඩ කුලී පදනම මත සැපයීම
07. කුළු බඩු එකතුකිරීම හා අලෙවිය
08. කෘෂි උපකරණ අලෙවිය
09. කොමිස් නියෝජිතවරුන්/ වෙන්දේසිකරුවන්
10. ඛනිජ තෙල් හා ලිහිසුම් තෙල් අලෙවිය
11. ගෘහ නිර්මාණ සැළසුම් සකසන ස්ථානයක් පවත්වාගෙන යාම
12. ගෘහ භාණ්ඩ අලෙවිය
13. ගෘහ සේවක සේවිකාවන් සැපයීම
14. ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය
15. ග්‍රොසරියක් පවත්වාගෙන යාම
16. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
17. තරාදි අලෙවිය

18. තේ පිටි සකස් කිරීම හා අලෙවිය
19. තොග වෙළඳාම
20. දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම
21. දැව/ ලී අලෙවිය
22. දුම්පරීක්ෂණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
23. දුරකථන අලෙවිය
24. දුරකථන සේවා (කොමිනිකේෂන්)
25. දේශීය වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම /ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
26. නිමි ඇඳුම් අලෙවිය
27. නොතාරිස්/ නීතිඥ කාර්යාලයක් පවත්වාගෙන යාම
28. පරිගණක අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
29. පරිසනක/ පරිසනක උපාංග අලෙවිය
30. පාවහන් අලෙවිය
31. පුද්ගලික නියෝජිත තැපැල් කාර්යාල
32. පූජා භාණ්ඩ අලෙවිය
33. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
34. ප්ලාස්ටික් භාණ්ඩ අලෙවිය
35. බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම (මෙඩිකල් සෙන්ටර්ස්)
36. රටබීම අලෙවිය
37. මල් සහ පැළ වර්ග අලෙවිය
38. මැටි භාණ්ඩ අලෙවිය
39. මිශ්‍ර වෙළඳාම
40. මූල්‍ය ආයතන
41. මෝටර් වාහන අමතර කොටස් අලෙවිය
42. මෝටර් සයිකල් අලෙවිය
43. යන්ත්‍රසූත්‍ර කුලී පදනම මත සැපයීම
44. රක්ෂණ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
45. රථ වාහන අලෙවිය
46. රථ වාහන කුලී පදනම මත යෙදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
47. රන් භාණ්ඩ ස්වර්ණාභරණ අලෙවිය
48. රා තැබෑරුමක් පවත්වාගෙන යාම
49. රියදුරු පුහුණු පාසැලක් පවත්වාගෙන යාම
50. රෙදිපිළි වෙළඳාම
51. රේස් ඔට්ටුපොලක් පවත්වාගෙන යාම
52. ලිපිද්‍රව්‍ය පාසැල් උපකරණ අලෙවිය
53. ලේ/ මුත්‍ර පරීක්ෂාව /රසායනාගාර සේවාවන් පවත්වාගෙන යාම
54. ලොතරැයි අලෙවිය
55. විදුලි උපකරණ අලෙවිය

56. විසිතුරු භාණ්ඩ අලෙවිය (ලවර්ස්)

57. වීඩියෝ පටි/ තැටි කුලියට දීම හා අලෙවිය

58. ව්‍යායාම උපකරණ අලෙවිය

59. ශබ්ද විකාශන යන්ත්‍ර කුලී පදනම මත සැපයීම

60. ශරීර සුවතා මධ්‍යස්ථාන

61. සාත්තුසේවා කටයුතු

**2023 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම.**

1939 අංක 61 දරණ නගර සභා ආඥා පනත හෙවත් ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරයේ 162 වන වගන්තිය හා 164 වන වගන්තිය ප්‍රකාරව හා 2019-12-05 දිනැති අංක 2152/34 අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පළ කර ඇති බලංගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන අන්තරාදායක,අප්‍රසන්න,අන්තරාදායක සහ අප්‍රසන්න ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරවත්, පනතේ 164 වගන්තියේ 1 තීරයේ සඳහන් වාර්ෂික වටිනාකම් මත එහි 11 තීරයේ සඳහන් බලපත්‍ර ගාස්තු 2019-12-05 දිනැති අංක 2152/34 අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කාර්යයන් සඳහා අය කරනු ලැබේ.

තවද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරණ සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති හෝටලයක්, ආපනශාලාවක්, නවාතැන්පලක් වන විටකදී ඊට අදාළ බලපත්‍ර ලබාදීමේදී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ පෙර වර්ෂයේ ලැබීම් වලින් 1%(සියයට එක)ක් බලපත්‍ර ගාස්තු ලෙස 2023 වර්ෂය සඳහා නියම විය යුතු බව, එම නියමය 2023 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

| I වන තීරය | 11 වන තීරය |
|---|---|
| වාර්ෂික වටිනාකම- | රු.ශත |
| රු,750 නොයික්මවන විට | 500.00 |
| රු,750 ඉක්මවන නමුත් රු,1500 නොයික්මවන විට | 750.00 |
| රු,1500 නොයික්මවන විට | 1,000.00 |

**III. 2023 වර්ෂය සඳහා බල්ලන් ලියාපදිංචි කිරීමේ ගාස්තු පැනවීම.**

බල්ලන් ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 4 වැනි වගන්තිය අනුව බලංගොඩ නගර සභා සීමාව ඇතුළත ඇති කරනු ලබන සෑම බල්ලෙක් හා බැල්ලියක් වෙනුවෙන් 2023 වර්ෂයේදී මෙම සභාවට ගෙවිය යුතු වාර්ෂික බල්ලන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව හා කරපටි ගාස්තුව ලෙස රුපියල් දෙසියය (200.00)ක් විය යුතු බවට පනවා එම පැනවීම 2023 වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

**IV. 2023 වර්ෂය සඳහා කසළ ගාස්තු පැනවීම.**

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය වූ නගර සභා ආඥා පනතේ 170(අ) 1,2 වගන්ති හා එහි 157(9)(ආ) ප්‍රකාරවත් 1952 අංක 06 දරණ පළාත් පාලන මණ්ඩල ආදර්ශ උපනීති XXI අනුවත්, 2013-06-28 දිනැති නගර සභා බල ප්‍රදේශ තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා අනුව කසළ ගාස්තු අය කල යුතු ආයතන හා ගාස්තු පහත පරිදි වේ.

| ස්වභාවය | වාර්ෂික ගාස්තු රු |
|---|---|
| නවාතැන්පල | 6,000.00 |
| හෝටල් | 6,000.00 |
| බේකරි | 6,500.00 |
| රෙදිකඩ | 6,500.00 |
| බත් කඩ,කෝපි කඩ,ආපන ශාලා,තේ කඩ | 3,600.00 |
| භෝජනාගාර | 6,000.00 |
| සුපිරි වෙළඳසැල් | 15,600.00 |
| සිල්ලර කඩ | 2,500.00 |
| සැලූන්,රූපලාවන්‍යාගාර | 3,500.00 |
| වී මෝල් | 4,000.00 |
| පුද්ගලික පන්ති | 10,000.00 |
| තොග වෙළඳසැල් | 10,000.00 |
| හාඩ්වෙයාර් | 10,000.00 |
| සුරාසැල් | 10,000.00 |

**V. 2023 වර්ෂය සඳහා ගෝ ඝාතක ආඥා පනත ප්‍රකාරව කොටු ගාස්තු පැනවීම.**

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය හෙවත් 1939 අංක 61 දරණ නගර සභා ආඥා පනතේ 162(1) අ වන වගන්තිය ප්‍රකාරව සභාව වෙත පැවරී ඇති බලතල අනුව 1893 අංක 09 දරණ ගෝ ඝාතක ආඥා පනතේ 09 වන වගන්තිය ප්‍රකාරවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍ර අංක 10939 හා 1956-06-08 ගැසට් නිවේදනයේ අංක XV අනුව මෙහි පහත උපලේඛනයේ සඳහන් පරිදි කොටු ගාස්තු නියම කර 2023 වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

උපලේඛනය

- ගවයෙක් ඝාතනය කිරීමේ කොටු ගාස්තුව — රු 300.00
- එළුවෙක් ඝාතනය කිරීමේ කොටු ගාස්තුව — රු, 150.00
- තාවකාලික සෝ ඝාතක බලපත්‍ර ගාස්තුව — රු 1,000.00
- වාර්ෂික සෝ ඝාතක බලපත්‍ර ගාස්තුව — රු 1,000.00

**VI. 2023 වර්ෂය සඳහා බලංගොඩ නගර සභාවෙන් සපයනු ලබන සේවාවන් සඳහා ගාස්තු පැනවීම.**

උප ලේඛනය

| අනු අංකය | සේවාව | කාරණය | 2023 වර්ෂයට ගාස්තුව |
|---|---|---|---|
| 01 | ජල සහතිකයක් ලබා ගැනීම | ■ අයදුම්පත්‍ර ගාස්තුව<br>■ සහතික ගාස්තුව | රු,300.00<br>රු,600.00 |
| 02 | විදුලි සහතිකයක් ලබා ගැනීම | ■ අයදුම්පත්‍ර ගාස්තුව<br>■ සහතික ගාස්තුව | රු,300.00<br>රු,600.00 |
| 03 | ගොඩනැගිලි රේඛා සහතිකයක් ලබා ගැනීම | ■ අයදුම්පත්‍ර ගාස්තුව<br>■ සහතික ගාස්තුව | රු,300.00<br>රු,1.250.00 |
| 04 | ජල බවුසරය කුලියට සැපයීම | ■ පානීය ජල බවුසරයක්<br>■ පානීය නොවන ජල බවුසරයක්<br>■ ස්ථානයේ නතරකර තැබීම දිනකට<br>(මාර්ග සංවර්ධන කටයුතුවලදී ජලය ඉසීම හෝ පාර සේදීම වෙනුවෙන් එක ජල බවුසරයක් සඳහා අමතරව) | රු,6,000.00<br>රු,5,300.00<br>රු,4,000.00<br><br>රු,2,500.00 |

| | | | |
|---|---|---|---|
| | | (නගර සීමාවෙන් පිටතට ධාවනය වන සෑම කි.මී 1ක් යාම සහ ඒම සඳහා රු,350/= බැගින් අය කෙරේ.) | |
| 05 | ක්‍රීඩා පිටිය කුලියට දීම | ■ ක්‍රීඩා පිටිය පමණක් දිනකට<br>■ ප්‍රේක්ෂකාගාරය සමඟ දිනකට<br>■ සැණකෙලි හා සංගීත සංදර්ශන එක් රාත්‍රියක් පැවැත්වීම සඳහා<br>■ ක්‍රීඩා උත්සව පැවැත්වීම-එක් රාත්‍රියක් සඳහා | රු, 5,000.00<br>රු, 8,000.00<br>රු,25,000.00<br>රු,10,000.00 |
| 06 | ජේ.සී.බී. යන්ත්‍රය කුලියට දීම | යන්ත්‍ර පැයක් සඳහා(ක්‍රියාකරු හා ඉන්ධන සමඟ) | රු,6,500.00 |
| 07 | ලෙලෙන තලනය කුලියට දීම(ටොන් 01)<br>ලෙලෙන තලනය කුලියට දීම(ටොන් 01)<br>ලෙලෙන තලනය කුලියට දීම(ටොන් 10) | පැය අටක සේවා දින භාගයක් සඳහා (දින 1/2)<br>පැය අටක සේවා දිනක් සඳහා<br>යන්ත්‍ර පැය එකක් සඳහා (ක්‍රියාකරු හා ඉන්ධන සමඟ) | රු,3,500.00<br>රු,5,000.00<br>රු,5,900.00 |
| 08 | මෝටර් ග්‍රේඩරය කුලියට දීම | යන්ත්‍ර පැය එකක් සඳහා(ක්‍රියාකරු හා ඉන්ධන සමඟ) | රු,6,500.00 |
| 09 | කොඩි කණු කුලියට ලබා දීම | එක කණුවක් එක දිනකට | රු,150.00 |
| 10 | ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීම | අයදුම්පත්‍ර ගාස්තුව | රු,500.00 |
| 11 | බිම් කට්ටි සැළසුම් අනුමත කිරීම | අයදුම්පත්‍ර ගාස්තුව | රු,300.00 |
| 12 | ගලි සේවාව සැපයීම ලීටර් 2500 ගලි බවුසරය සඳහා | • නගර සීමාවේ නිවාස/ ආගමික ස්ථාන/ පුණ්‍ය ස්ථාන/ පාසැල් හා රජයේ ස්ථාන | රු,8,500.00 |
| | | ■ නගර සීමාවේ ව්‍යාපාරික ස්ථාන සඳහා | රු,10,000.00 |
| | | ■ නගර සීමාවෙන් පිටත නිවාස/ආගමික ස්ථාන/ පුණ්‍ය ස්ථාන/ පාසැල් හා රජයේ ස්ථාන | රු,11,000.0 |
| | | ■ නගර සීමාවෙන් පිටත ව්‍යාපාරික ස්ථාන සඳහා | රු,13,000.0 |
| | | ■ නගර සීමාවෙන් පිටතට යන සෑම කිලෝමීටර් 1ක් යාම සහ ඒම සඳහා | රු,350.00 |
| | ගලි සේවාව සැපයීම ලීටර් 4000 ගලි බවුසරය සඳහා | ■ නගර සීමාවේ නිවාස/ ආගමික ස්ථාන/ පුණ්‍ය ස්ථාන/ පාසැල් හා රජයේ ස්ථාන | රු,16,500.00 |
| | | ■ නගර සීමාවේ ව්‍යාපාරික ස්ථාන සඳහා | රු,20,000.00 |
| | | ■ නගර සීමාවෙන් පිටත නිවාස/ආගමික ස්ථාන/ පුණ්‍ය ස්ථාන/ පාසැල් හා රජයේ ස්ථාන | රු,20,000.00 |
| | | ■ නගර සීමාවෙන් පිටත ව්‍යාපාරික ස්ථාන සඳහා | රු,24,000.00 |
| | | නගර සීමාවෙන් පිටතට යන සෑම කිලෝමීටර් 1ක් යාම සහ ඒම සඳහා | රු,900.00 |
| 13 | සුසාන භූමි ගාස්තු | ■ මිනියක් මිහිදන් කිරීම<br>■ සභා සේවකයින් 02ක් සැපයීමේ ගාස්තුව<br>■ ස්මාරක ඉදිකිරීමේ ගාස්තුව<br>■ අළු තැන්පත් කිරීම වර්ග අඩි 01ක කුටිය | රු, 750.00<br>රු,5,000.00<br>අවසර නැත<br>රු,25,000.00<br>රු,2,000.00 |

| | | | |
|---|---|---|---|
| | | ■ මිනියක් මිහිදන් කිරීම-නගර සීමාවෙන් පිටත<br>■ සභා සේවකයින් 02ක් සැපයීමේ ගාස්තුව- නගර සීමාවෙන් පිටත | රු10,000.00 |
| 14. | නොපවරා ගැනීමේ සහතිකයක් ලබා ගැනීම | ■ අයදුම්පත්‍ර ගාස්තුව<br>■ සහතික ගාස්තුව | රු,300.00<br>රු,1,250.00 |
| 15. | අනතුරුදායක ගස් පරීක්ෂා කිරීම | • පරීක්ෂණ ගාස්තු | රු, 500.00 |
| 16. | වරිපනම් ලේඛනයේ නම සංශෝධනය කිරීම | අයදුම්පත්‍ර ගාස්තුව | රු,200.00 |
| 17. | තක්සේරු ලේඛනයට නම ඇතුළත් කිරීම | ලියාපදිංචි ගාස්තුව | රු,5,000.00 |
| 18. | තක්සේරු ලේඛනයේ පිටපතක් ලබා ගැනීම | පිටපතක් සඳහා ගාස්තු | රු,500.00 |
| 19. | වරිපනම් උදෘත ලබා ගැනීම | එක් වර්ෂයක් සඳහා ගාස්තුව | රු,250.00 |
| 20. | ප්‍රචාරක දැන්වීම්,බැනර්,පෝස්ටර්, කටවුට් ප්‍රදර්ශනය කිරීම<br><br>ප්‍රචාරකදැන්වීම්,බැනර්, පෝස්ටර්,කටවුට් ප්‍රදර්ශනය කිරීම | වර්ග අඩි 01ක් දින 14ක් ප්‍රදර්ශනය කිරීම<br><br>වර්ග අඩි 01ක් මාසයක් ප්‍රදර්ශනය කිරීම | රු,150.00<br><br>රු,300.00 |
| 21. | දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම | ස්ථිර වර්ග අඩි 01 ක් වර්ෂයක් සඳහා ප්‍රදර්ශනය කිරීම<br><br>වර්ග අඩි 01ක් සභා දේපල තුළ වර්ෂයක් ප්‍රදර්ශනය සඳහා බිම් කුලිය | රු,300.00<br><br>රු,500.00 |
| 22. | අනවසර ප්‍රචාරක දැන්වීම් සඳහා දඩ ගාස්තු | කටවුට් වර්ග අඩි 01ක් සඳහා<br>පෝස්ටර් වර්ග අඩි 01ක් සඳහා<br>බැනර් වර්ග අඩි 01ක් සඳහා | රු,200.00<br>රු,100.00<br>රු,200.00 |
| 23. | එල්.ඊ.ඩී ප්‍රචාරක දැන්වීම් | වර්ග අඩි 01ක් මාසයක් ප්‍රදර්ශනය කිරීම සඳහා | රු,200.00 |
| 24. | පුස්තකාල ගාස්තු අය කිරීම. | ■ සාමාජික අයදුම් පත්‍ර ගාස්තුව<br>■ නගර සීමාව තුළ ළමා සාමාජික ගාස්තු<br>■ නගර සීමාව තුළ වැඩිහිටි සාමාජික ගාස්තු<br>■ නගර සීමාව තුළ ළමා සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තු<br>■ නගර සීමාව තුළ වැඩිහිටි සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තු<br>■ නගර සීමාවෙන් පිට වැඩිහිටි සාමාජික ගාස්තු<br>■ නගර සීමාවෙන් පිට ළමා සාමාජික ගාස්තු ■ නගර සීමාවන් පිට ළමා සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තුව<br>■ නගර සීමාවන් පිට වැඩිහිටි සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තුව<br>■ පාඨක සමාජයට ඇතුළත් වීමේ ගාස්තුව<br>■ පාඨක සමාජයේ සාමාජික ගාස්තු වසර දෙකක් සඳහා<br>■ එක් දිනකට එක් පොතක් සඳහා පොත් ප්‍රමාද ගාස්තුව<br>■ නැතිවූ පොතක් සඳහා පොතේ නියම වටිනාකම සහ දෙපාර්තමේන්තු ගාස්තු ලෙස පොතේ වටිනාකමින් | රු 50.00<br>රු 200.00<br>රු 300.00<br>රු 100.00<br>රු 100.00<br>රු,500.00<br>රු,200.00<br>රු,200.00<br>රු,200.00<br>රු,20.00<br>රු,480.00<br>රු, 2.00<br>25%<br>රු,500.00 |

| | | | |
|---|---|---|---|
| | | ■ පොත් බැඳීමේ ගාස්තු | |
| 25. | පා පැදි බලපත්‍රය | ■ අයදුම්පත්‍ර ගාස්තුව<br>■ බලපත්‍රය | රු,100.00<br>රු,5.00 |
| 26. | අනුමත මිනින්දෝරු සැළැස්ම | ■ සහතික පිටපතක් නිකුත් කිරීම<br>■ ලේඛන සෙවීමේ ගාස්තු-නම පමණක් ලබා දී ඇති විට<br>■ ලේඛන සෙවීමේ ගාස්තු-නම හා වර්ෂය ලබා දී ඇති විට<br>■ ලේඛන සෙවීමේ ගාස්තු-නම හා අංකය ලබා දී ඇති විට | රු, 500.00<br>රු, 800.00<br>රු,600.00<br>රු,400.00 |
| 27. | අනුමත ගොඩනැගිලි සැළැස්ම | ■ කාලය දීර්ඝ කර ගැනීම-එක් වසරක් සඳහා<br>■ සහතික පිටපතක් නිකුත් කිරීම<br>■ ලේඛන සෙවීමේ ගාස්තු-නම පමණක් ලබා දී ඇති විට<br>■ ලේඛන සෙවීමේ ගාස්තු-නම හා වර්ෂය ලබා දී ඇති විට<br>■ ලේඛන සෙවීමේ ගාස්තු-නම හා අංකය ලබා දී ඇති විට | රු,1,000.00<br>රු,1,000.00<br>රු, 800.00<br>රු,600.00<br>රු,400.00 |
| 28. | පෙර පාසැල | ■ ළමුන් ඇතුළත් කිරීමේ ගාස්තුව - බළන්ගොඩ නගර සභා පෙර පාසල සඳහා<br>■ වැවවත්ත පෙර පාසල සඳහා<br>■ බෝම්බුව පෙර පාසල සඳහා | රු,5,000.00<br>රු,1,000.00<br>රු,1,000.00 |
| 29. | අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් | ■ එක් දිනක් සඳහා බිම් බද්ද<br>■ වැඩිවන අමතර දිනයක් සඳහා | රු,6,000.00<br>රු,2,000.00 |
| 30 | කාබනික පොහොර අළෙවිය | ■ කිලෝ 50 පොහොර උරයක්<br>■ කිලෝ 25 පොහොර උරයක්<br>■ කිලෝ 10 පොහොර උරයක්<br>■ ගලි පොහොර කිලෝ 01ක් සඳහා (කාබනික පොහොර කිලෝ 01 ක මිල රු,15.00 බැගින් කවර රහිතව ලබා දෙයි.මුද්‍රිත කවරයේ ලබා ගන්නේ නම් කවරයේ වටිනාකම අය කරනු ලැබේ.පාවිච්චි කරන ලද කවරයක පොහොර ලබා ගන්නේ නම් එම කවරයේ වටිනාකම අය කරනු ලැබේ) | රු,750.00<br>රු,375.00<br>රු,150.00<br>රු,25.00 |
| 31 | මාර්ග පළුදු කිරීම | ■ කාපට් ඇතිරූ මාර්ග තලය පළුදු කිරීම<br>■ තාර/ කොන්ක්‍රීට්/ අන්තර් සම්බන්ධිත ගල් අතුරන ලද මාර්ග තලය පළුදු කිරීම වර්ග මීටර් 01ක් සඳහා<br>■ පස් සහිත මාර්ග උරහිස සහ මාර්ග තලය පළුදු කිරීම වර්ග මීටර් 01ක් සඳහා | අවසර නැත<br>රු,1,500.00<br>රු,300.00 |
| 32 | පොදු වැසිකිළි යාමේ ගාස්තු | ■ වැසිකිළි/ කැසිකිළි යාම සඳහා එක් වරකට<br>■ බස් නැවතුම්පළ උඩු මහලේ ඇති වැසිකිලිය බස්නැවතුම්පළ බස්රථ රියදුරන් හා කොන්දොස්තර මහතුන් සඳහා එක් වරකට වැසිකිලි කැසිකිලි යාම | රු,20.00<br>රු,10.00 |
| 33 | හිස් තාර බැරල් | ■ එක තහඩුවක් සඳහා | රු,300.00 |
| 34 | ලේඛනාගාරයෙන් ලිපි/ලේඛන ස්කෑන් කර ලබා ගැනීම. | ■ A-4 කොලයක් සඳහා<br>( A-4 කොල 25කට වඩා ස්කෑන් පිටපත් අවශ්‍ය වන්නේ නම් 1ක් රු,7.00 ක් වේ)<br>■ ලීගල් කොලයක් සඳහා | රු,40.00 |

| | | | |
|---|---|---|---|
| | | (ලීගල් කොල 25කට වඩා ස්කෑන් පිටපත් අවශ්‍ය වන්නේ නම් 1ක් රු,8.00වේ.)<br>■ A-3 කොලයක් සඳහා<br>■ A-3 කොලවලට වඩා ප්‍රමාණයෙන් විශාල කොළ වර්ග අඩියක් සඳහා | රු,50.00<br>රු,80.00<br>රු,70.00 |
| 35 | බලංගොඩ නව බස්නැවතුම්පොළ කඩ කාමර සඳහා | ■ ජල සම්බන්ධතා ලබා ගැනීමේ ගාස්තුව<br>■ ජල සම්බන්ධතා මාසික ගාස්තුව(මාසික ජල බිල් පත අනුව අය කරනු ලබයි)<br>■ විසන්ධි කළ ජල සම්බන්ධතාවය නැවත ලබා ගැනීම | රු,15,000.00<br>රු,1,000.00 |

ඉහත සඳහන් සියලු ගාස්තුවලට අමතරව රජයේ අනුමත බදු වෙනමම එකතු කරනු ලැබේ.

**VII. මස් පිණිස සතුන් මැරීම හෝ මරන ලද සතුන්ගේ මස් ප්‍රදර්ශනය සම්පූර්ණයෙන්ම තහනම් දින නිවේදනය කිරීම - 2023 වර්ෂය**

පහත උප ලේඛනයේ විස්තර කරනු ලබන දිනයනුත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් පනවනු ලබන දිනයනුත් බළන්ගොඩ නගර සභාව විසින් අවස්ථාවෝචිත පරිදි තීරණය කරනු ලබන දිනයන්හිත් , බළන්ගොඩ නගර සීමාවේ 2023 වර්ෂයේ මස් පිණිස සතුන් මැරීම හෝ මරන ලද සතුන්ගේ මස් විකිණීම හෝ විකිණීම සඳහා මස් ප්‍රදර්ශනය කිරීම, විකිණීම සඳහා මස් ළඟ තබා ගැනීම නොකළ යුතුය.

උපලේඛනය

| අනු අංකය | වර්ෂය | මාසය | දිනය | කාරණය |
|---|---|---|---|---|
| 01 | 2023 | ජනවාරි | 06-සිකුරාදා | දුරුතු පුර පසළොස්වක පෝය දිනය |
| 02 | 2023 | ජනවාරි | 15- ඉරිදා | තෛපොන්ගල් දිනය |
| 03 | 2023 | පෙබරවාරි | 04- සෙනසුරාදා | ජාතික නිදහස් දිනය |
| 04 | 2023 | පෙබරවාරි | 05-ඉරිදා | නවම් පුර පසළොස්වක පෝය දිනය |
| 05 | 2023 | පෙබරවාරි | 18-සෙනසුරාදා | මහා ශිව රාත්‍රී දිනය පෝය දිනය |
| 06 | 2023 | මාර්තු | 07-අඟහරුවාදා | මැදින් පුර පසළොස්වක පෝය දිනය |
| 07 | 2023 | අප්‍රේල් | 05-බදාදා | බක් පුර පසළොස්වක පෝය දිනය |
| 08 | 2023 | අප්‍රේල් | 07-සිකුරාදා | මහ සිකුරාදා දිනය |
| 09 | 2023 | අප්‍රේල් | 13-බ්‍රහස්පතින්දා | සිංහල දෙමළ අළුත් අවුරුදු දිනට පෙර දිනය |
| 10 | 2023 | අප්‍රේල් | 14-සිකුරාදා | සිංහල දෙමළ අළුත් අවුරුදු දිනය |
| 11 | 2023 | අප්‍රේල් | 22-සෙනසුරාදා | රාමසාන් උත්සව දිනය |
| 12 | 2023 | මැයි | 01-සඳුදා | මැයි දිනය |
| 13 | 2023 | මැයි | 05-සිකුරාදා | වෙසක් පුර පසළොස්වක පෝය දිනය |
| 14 | 2023 | මැයි | 06-සෙනසුරාදා | වෙසක් පුර පසළොස්වක පෝය දිනට පසු දිනය |
| 15 | 2023 | ජූනි | 03-සෙනසුරාදා | පොසොන් පුර පසළොස්වක පෝය දිනය |
| 16 | 2023 | ජූනි | 29-බ්‍රහස්පතින්දා | හජ්ජි උත්සව දිනය |
| 17 | 2023 | ජූලි | 03-සඳුදා | ඇසළ පුර පසළොස්වක පෝය දිනය |
| 18 | 2023 | අගෝස්තු | 01-අඟහරුවාදා | නිකිනි පුර පසළොස්වක පෝය දිනය |
| 19 | 2023 | අගෝස්තු | 30-බදාදා | අමතර නිකිනි පුර පසළොස්වක පෝය දිනය |
| 20 | 2023 | සැප්තැම්බර් | 28-බ්‍රහස්පතින්දා | නබිනායක තුමාගේ උපන්දිනය |
| 21 | 2023 | සැප්තැම්බර් | 28-බ්‍රහස්පතින්දා | බිනර පුර පසළොස්වක පෝය දිනය |
| 22 | 2023 | ඔක්තොම්බර් | 28-සෙනසුරාදා | වප් පුර පසළොස්වක පෝය දිනය |
| 23 | 2023 | නොවැම්බර් | 12-ඉරිදා | දීපවාලි උත්සව දිනය |

| | | | | |
|---|---|---|---|---|
| 24 | 2023 | නොවැම්බර් | 26-ඉරිදා | ඉල් පුර පසළොස්වක පෝය දිනය |
| 25 | 2023 | දෙසැම්බර් | 25-සඳුදා | නත්තල් දිනය |
| 26 | 2023 | දෙසැම්බර් | 26-අඟහරුවාදා | උඳුවප් පුර පසළොස්වක පෝය දිනය |

**VIII. රථවාහන නැවතුම් සීමාව , රථ වාහන නැවතුම් ගාස්තු සහ රථ වාහන ඇතුළු කිරීමේ ගාස්තු නිවේදනය කිරීම -2023 වර්ෂය**

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය හෙවත් 1939 අංක 61 දරණ නගර සභා ආඥා පනතේ 157(14)(අ) වගන්ති ප්‍රකාරවත් ඊට අදාළ අතුරු ව්‍යවස්ථාවන් යටතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරවත් බළන්ගොඩ නගර සභා බලසීමාවේ රථ වාහන නැවතුම් සීමාව ,රථ වාහන නැවතුම් ගාස්තු සහ රථවාහන ඇතුළු කිරීමේ ගාස්තු අය කරනු ලබන සීමාව පහත I වන උප ලේඛනයේ සවිස්තරාත්මකව දක්වන ලද ආකාරයටත්, එම සීමාව ඇතුළත නතර කරනු ලබන එක් එක් රථ වාහනයකින් එක් දිනයකට අයකළ හැකි උපරිම ගාස්තු මුදල පහත II වන උප ලේඛනයේ සවිස්තරාත්මකව දැක්වෙන ආකාරයට විය යුතු ය

**ඉහත කී I වන උපලේඛනය**

බළන්ගොඩ නගර සභා බල සීමාවේ වෙළඳපල සීමාව ලෙස නම් කර ඇති සීමාවේ කොටසක් වන බළන්ගොඩ බදුල්ල මාර්ගයේ කිරිදිගල පල්ලිය (වැලිහරනාව හන්දිය) දක්වා ද, බළන්ගොඩ රාස්සගල පාරේ කොන්වන්ට් විදුහල දක්වා ද, බළන්ගොඩ රත්නපුර මාර්ගයේ HLW ඉන්ධන පිරවුම්හල දක්වාද, බළන්ගොඩ කල්තොට පාරේ ධර්මරත්න බස්නායක මහතාගේ නිවස දක්වාද, දොරවෙල නව අතුරු මාර්ගය( මොහාන් සාලිය එල්ලාවල මාවත) ද, ඇතුළත් වන පරිදි බළන්ගොඩ නගරයේ කෙළින් වීදිය, තානායම් පිවිසුම් පාර, බාන්ස් රත්වත්ත මාවත, බස් නැවතුම්පල පාර, පල්ලිය පාර හා ඒ ඇතුළත ඇති සියලුම වීථීන් හා වීථීන් දෙපස ගොඩනැගිලි සීමාව ඇතුළත වන සීමාව වේ.

**ඉහත කී II වන උපලේඛනය**

- ලොරියක්, බස්රථයක් හෝ වෙන යම් වාහනයක් සඳහා - රු. 100.00
- වෑන් රථයක්, ජීප් රථයක් සඳහා - රු. 50.00
- මෝටර් කාර් රථයක් හෝ මෝටර් රථයක් - රු. 50.00
- ත්‍රී රෝද රථයක් - රු. 20.00

**IX. 2023 වර්ෂය සඳහා විනෝද බදු අය කිරීම.**

විනෝද බදු ආඥා පනතේ 06 වන වගන්තිය අනුව බලංගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ සිනමා ශාලා වල සිනමා දර්ශන සඳහා නිකුත් කරන ටිකට් පතක මුහුණත වටිනාකමින් 7.5% ක්ද ,අනෙකුත් විනෝද කටයුතු සඳහා ටිකට්පතක මුහුණත වටිනාකම රු,100.00 නොඉක්මවන අවස්ථාවක 20% ක ප්‍රතිශතයක්ද, ටිකට්පතක මුහුණත වටිනාකම රු,100.00 ට වැඩි අවස්ථාවක 25% ක විනෝද බදු ප්‍රතිශතයක් අය කරනු ලබන අතර එය 2023 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:09 බුලත්ගම සුසාන භූමිය සඳහා දීමනා පදනම මත සුසාන භූමි භාරකරුවකුගේ සේවය ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:10 2018 වර්ෂයේ පදික කඩ හිමියන්ගේ නාම ලේඛනයේ ඇතුලත්ව ඇති නමුත් කඩයක් හිමි නොවූ බළන්ගොඩ, ගඟ අද්දර පාර, මිරිස්වත්ත ලිපිනයේ එස්.චන්ද්‍රිකා යන අය වෙත පදික කඩ කාමරයක් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පදික කඩ හිමි නාම ලේඛනයේ පළමුවෙන්ම සුබ්‍රමනියම් චන්ද්‍රිකා යන නම සඳහන්ව ඇති අතර, එම කාලයේ පැවති සියලුම රැස්වීම් සඳහා සහභාගී වී ඇති නමුත් කඩයක් හිමි නොවූ බැවින් කඩයක් ලබා දෙන ලෙස ඉල්ලීමක් තමන්ට කළ බව ද ඒ අනුව සභාවේ තීරණයක් ගැනීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් පදික කඩ ලබා දීමේ දී පළාත් සභාවේ විමර්ශන නිලධාරී බණ්ඩාර මහතා සහභාගී වූ අතර, එහි දී මෙම අයට කඩය නොලැබෙන්නට හේතුව කුමක්දැයි සොයා බැලිය යුතු බව ද එම අවස්ථාවේ කඩ දෙකක් ඉතිරිව තිබූ බව ද දීර්ඝ කාලයක් තිස්සේ එම කඩ දෙක ඉතුරු වී තිබූ පසුව ඉවත් කර පාරක් සකස් කළ බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා අදහස් දක්වමින් කඩයක් නොලැබීමට හේතුව වඩේ විකිණීම බවට ආරංචි වූ නමුත් මෙම අය අවුරුදු 20-25 ක් තිස්සේ පදික වෙළඳාමේ යෙදෙන බව ද සුදුසු ස්ථානයක් පවතී නම් පදික වෙළඳාමෙන් ඉවත් කරන අය වෙත කඩ ලබා දී සභාවට ආදායමක් ගැනීම සුදුසු බව ද තමන් මැණික් ව්‍යාපාර කටයුතු සිදු කරන්නේ පදික වේදිකාවේ බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා ඔවුන් ඉල්ලා සිටින ස්ථානය කුමක් දැයි විමසන ලදී.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් පැවසුයේ බළන්ගොඩ බස් නැවතුම්පළ ඩිජිටල් දැන්වීම් පුවරුව අසල ස්ථානය ලබා දෙන ලෙස ඉල්ලා සිටි බවයි.

නැවත වරක් අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා, විවිධාකාර ක්‍රමවේදවලින් රජය සතු හා සභාව සතු අඟලක් හෝ මංකොල්ල කෑමට කටයුතු කරන මෙම යෝජනා යටින් පිරිසක් සිටින බව ද සභාවේ දේපල ආරක්ෂා කර ගත යුතු අතර, සභාවේ කටයුත්තකට මෙම ස්ථානය සුදුසු වන අතර, වෙනත් ඉදිකිරීම් සඳහා එම ස්ථානය යොදා නොගන්නා ලෙසද මනුස්සයෙකුට ජීවත් වෙන්න උපකාරයක් කළ යුතු වුවත් මෙම ස්ථානය ලබා දීමට තමන් විරුද්ධ බව ද පදික කඩ කාමර අතරින් මුදල් ගෙවා නොමැති කඩ තිබේ නම් එම කඩයක් ලබා දෙන ලෙස ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් දීර්ඝකාලයක් තිස්සේ පදික වෙළඳාමේ නිරත වන අයෙක් බැවින් කඩයක් ලබා දීම සුදුසු බවයි.

ගරු සභාපතිතුමා පැවසූයේ හිටපු ගරු සභාපතිතුමා වන චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ පාලන කාලය තුල මුදල් කමිටුවේ තීරණයක් මත කඩයක් ලබා දී තිබුණු නමුත් තමන් සභාවට මෙම යෝජනාව ඉදිරිපත් කර විවෘතව විනිවිදභාවයෙන් යුතුව තීරණ ගැනීමට ඉදිරිපත් කළ බවයි.

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් ඩිජිටල් දැන්වීම් පුවරුව පවතින ස්ථානයේ කඩයක් ලබා දීමට තමන් විරුද්ධ අතර, එම ස්ථානයේ බස් හරවන බැවින් අවහිරයක් වන බව ද හිස් කඩයක් තිබේ නම් ලබා දීමේ ගැටලුවක් නොමැති බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය මෙම ස්ථානයේ ත්‍රීවිල් දෙකක් පවතින අතර, එම ත්‍රිවිල් ඉවත් නොකරන්නේ එම පුද්ගලයන් දෙදෙනා ගැන සිතා බව පැවසුවද මෙම ස්ථානයේ කඩයක් හදන්නේ නම් එම දෙදෙනාට කුමක් වන්නේ දැයි විමසීය. එමෙන්ම කඩයක් මෙම පුද්ගලයාට ලබා දීමේ ගැටලුවක් නොමැති වුවත් මෙම ස්ථානය ලබා දීමට විරුද්ධ බව පවසන ලදී.

මේ සම්බන්ධව ඇති වූ සාකච්ඡාවෙන් අනතුරුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා විසින් බළන්ගොඩ, ගඟ අද්දර පාර, මිරිස්වත්ත ලිපිනයේ සුබ්‍රමනියම් චන්ද්‍රිකා යන අය වෙත වෙළඳාම් කිරීම වෙනුවෙන් ගිවිසුම් කොන්දේසිවලට යටත්ව කඩ කාමර අංක 197/01/ඒ දරණ ස්ථානය සඳහා බිම් කුලිය වශයෙන් මාසිකව රු.3,000.00 ක් බැගින් අය කරගෙන තාවකාලික ඉදිකිරීමක් සඳහා ලබා දීමේ යෝජනාවට පක්ෂ හා විපක්ෂ බව විමසීම සඳහා බෙදීමක් යෝජනා කරන ලදුව එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද, රහස් ඡන්දයක්ද යන්න යෝජනා ස්ථිර කර ගන්නා ලෙස ගරු සභාපතිතුමන් විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

එහි දී විවෘත ඡන්දයකට යාම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

මෙහිදී, එම යෝජනාවට පක්ෂව සභිකයින් දොළොස් දෙනෙකු ද එනම්,

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ජී. වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රුමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනී | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රී | ලාල් ගලප්පත්ති මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රීනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී. පේමදාස මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එස්. ඒ. ජෝර්ජ් මැතිතුමා ද |

විපක්ෂව සභිකවරුන් හතර දෙනෙකුද එනම්,

1. ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතතුමා
2. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය
4. ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ද

ඡන්දය ප්‍රකාශ කළ අතර, ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා අද දින සභාවට නොපැමිණිනි.

ඒ අනුව බළන්ගොඩ, ගඟ අද්දර පාර, මිරිස්වත්ත ලිපිනයේ සුබ්‍රමනියම් චන්ද්‍රිකා යන අය වෙත වෙළඳාම් කිරීම වෙනුවෙන් ගිවිසුම් කොන්දේසිවලට යටත්ව කඩ කාමර අංක 197/01/ඒ දරණ ස්ථානය සඳහා බිම් කුලිය වශයෙන් මාසිකව රු.3,000.00 ක් බැගින් අය කරගෙන තාවකාලික ඉදිකිරීමක් සඳහා ලබා දීමේ යෝජනාව පක්ෂව ඡන්ද 12ක් ද, විපක්ෂව ඡන්ද 04 ක් ද වශයෙන් වැඩි ඡන්ද 08 කින් සභා සම්මත විය.

06៖01៖11 2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ලැයිස්තුව හා දැන්වීම දිනමිණ හා තිණකරන් පුවත්පත්වල එකවරක් පළ කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

| අනු අංකය | කාණ්ඩය |
|---|---|
| 01. | කාර්යාල උපකරණ හා ලිපි ද්‍රව්‍ය |
| 02. | වානේ ගෘහ භාණ්ඩ හා ලී බඩු |
| 03. | පරිගණක, පරිගණක උපාංග හා මුද්‍රණ තීන්ත, CD තැටි, ටෝනර්, කාර්ට්රිජ්, රිබන්, පරිගණක මෘදුකාංග |
| 04. | ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය |
| 05. | මාර්ග නඩත්තු උපකරණ හා ද්‍රව්‍ය<br>6×9, 6×4, 4×4, 4×2, 2×2, 1 1/2, 1, 3/4, 1/2 ප්‍රමාණයේ කළුගල්, ගල් කුඩු, ABC, සියලුම ජල සැපයුම් පයිප්ප හා උපාංග, හියුම් පයිප්ප, කොන්ක්‍රීට් නිෂ්පාදන, ගංගා වැලි |
| 06. | නාම පුවරු, දැන්වීම් හා සමරු ඵලක, බැනර්, කටවුට්, ඩිජිටල් පෝස්ටර් ආදිය |
| 07. | ක්‍රීඩා භාණ්ඩ, ළදරු පාසල් උපකරණ |
| 08. | තීන්ත වර්ග ( එනමල්, ඉමල්ෂන්, මළ නිවාරණ තීන්ත) |
| 09. | විදුලි උපකරණ ( විදුලි පහන් ඇතුළු සියලු විදුලි අයිතමයන්) |
| 10. | මුද්‍රණ කටයුතු හා රබර් මුද්‍රා නිෂ්පාදන, මුද්‍රිත පෝරම |
| 11. | කාර්යාල උපකරණ අලුත්වැඩියාව (යතුරුලියන, ඡායා පිටපත් යන්ත්‍ර, රෝනියෝ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, වේලා සටහන් යන්ත්‍ර, පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර ආදී අනිකුත් යන්ත්‍ර |
| 12. | වාහන සේවා/අලුත්වැඩියා, වාහන අමතර කොටස් (ටයර්, ටියුබ්, බැටරි ඇතුළු අනෙකුත් අමතර කොටස්) |
| 13. | කුලී පදනම මත ගල් වැලි ප්‍රවාහනය සඳහා ටිපර් රථ සැපයීම. |
| 14. | සෞඛ්‍යය උපකරණ හා විෂබීජ නාශක ද්‍රව්‍ය (සබන්, කුණු ඉවත් කිරීමේ ද්‍රව්‍ය) |
| 15. | පිඟන් භාණ්ඩ |
| 16. | පුස්තකාල පොත් |
| 17. | නිළ ඇඳුම් සඳහා රෙදි සැපයීම. |
| 18. | ශ්‍රව්‍ය උපකරණ, දෘශ්‍ය උපකරණ, පටිගත කිරීම් උපකරණ ආදිය සැපයීම. |
| 19. | පරිභෝජන භාණ්ඩ, වියළි සහ අනිකුත් ආහාර ද්‍රව්‍ය සැපයීම. |
| 20 | ඉහත සඳහන් නොවුණු වෙනත් අයිතමයන් (සඳහන් කරන්න) |

**කොන්ත්‍රාත්කරුවන්**

| අනු අංකය | කාණ්ඩය |
|---|---|
| 01. | රු. 100,000/- දක්වා |
| 02. | රු. 100,000/- සිට 250,000 දක්වා |
| 03. | රු. 250,000 සිට රු. 500,000/- දක්වා |
| 04. | රු. 500,000/- සිට 1,000,000 දක්වා |
| 05. | රු. 1,000,000/- ට වැඩි |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:12 නව බස්නැවතුම්පළ ඩී-14 දරණ කඩ කාමරය බදු ගෙන තිබූ එම්.සෝමා මාලනී යන අය 2022-07-06 වන දින මියගොස් ඇති අතර, එම කඩ කාමරයේ බදු අයිතිය ඇයගේ ස්වාමි පුරුෂයා වන ඩබ්.ඒ.විජේතිස්ස යන අය වෙත පැවරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:13 බළන්ගොඩ නගරයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී වන එච්.ඩී.ඒ. චාන්දනී යන අයට පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී කාර්යාලයක් පවත්වාගෙන යාම සඳහා තාවකාලිකව ස්ථානයක් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:14 2023 වර්ෂය සඳහා සභාව සතු වාහන රක්ෂණය කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:15 ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත මාර්ගස්ථ මුදල් රක්ෂණය සඳහා රු. 59,772.16 ක් හා විදුලි කාර්මික රක්ෂණය සඳහා රු. 13,412.31 ක් වශයෙන් රක්ෂණ වාරික ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:16 සභාව සතු වාහන සේවා කිරීම සඳහා ස්ථානීය ප්‍රසම්පාදන කමිටුවක් පත් කිරීම හා ඒ අනුව අදාල දිනයේ පවතින වෙළඳපොළ මිලට අදාල ස්ථානයට ගොස් කඩිනමින් අවශ්‍ය සේවා සිදු කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන් වශයෙන්,

i. නාගරික ලේකම්, ඩී.එම්.ජේ.යූ. ධර්මරත්න මහතා
ii. ගණකාධිකාරී, එම්.ඩී.එස්.ප්‍රනාන්දු මහතා
iii. වැඩ අධිකාරී, පී.ඩබ්.එස්. සේනාධීර මහතා

සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:17 ආපදා ණය මුදලින් වැඩිපුර අය වී ඇති ණය වාරික වන රු. 12,545.34 ක මුදල ආපසු යූ.ආර්.පියදාස (වැඩ ක්ෂේත්‍ර කම්කරු) යන අය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:18 2022-09-23 සිට 2022-10-02 දින දක්වා පැවති සංගීත සැණකෙළිය සඳහා බළන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටිය ලබා දීමේ දී ගිවිසුම්කරු විසින් කොන්දේසි කඩ කර ඇති අතර, එය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා නව ගිවිසුමකට එළඹී බැවින් ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2022 අයවැය මඟින් ක්‍රීඩා පිටිය සඳහා ඇස්තමේන්තු කර ඇති ආදායම රුපියල් ලක්ෂයක් වුව ද තමන් සභාපති වශයෙන් පත් වූ දා සිට මේ දක්වා රු.927,250.00 ක ආදායමක් ලබා ගෙන ඇති අතර, ඇතැම් මාධ්‍ය මඟින් බළන්ගොඩ ක්‍රීඩාංගනය විනාශ වී ඇති බවට පැවසුව ද මේ වන විට පෙර තිබූ තත්ත්වයට වඩා හොඳ තත්ත්වයේ පවතින බව ද මේ සඳහා උදව් කළ සියලුම නාගරික මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වන අතර, තමන් සභාපති වශයෙන් වගකීම ගත් බව ද ගිවිසුම උල්ලංඝනය වූ අවස්ථාවේ පොලීසියේ පැමිණිල්ලක් කර අදාල ඉදිරි ක්‍රියාමාර්ග ගත් බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් ක්‍රීඩා කරන සහ කරපු අය වශයෙන් පසුගියදා මේ සම්බන්ධව තීරණයේ දී තමන් විරුද්ධත්වය ප්‍රකාශ කළ අතර, ක්‍රීඩා තරඟ සඳහා සහභාගී වීමට සිටින ක්‍රීඩකයන් තම පුහුණු කටයුතු සඳහා වෙනත් ක්‍රීඩා පිටිවලට යාමට සිදු වී ඇති

බව ද ක්‍රීඩා පිටිය සකස් කළ බව පැවසුව ද වර්ෂාවක දී නැවත වලවල් මතු වෙන බැවින් මෙය නිසියාකාරව සකස් කරන තුරු රඳවා ගත් මුදල් නිදහස් නොකරන ලෙස ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් තමන් සභාපති වශයෙන් පත්වන අවස්ථාවේ දී ක්‍රීඩා පිට්ටනිය කසළ පිරුණු ස්ථානයක්ව තිබූ අතර, ඉන්පසුව මේ තත්ත්වයට දියුණු කළ බව ද පිට්ටනිය යට දැනටත් පවතින්නේ කසළ බව ද ජනතාවගේ විනෝදස්වාදය ගැන සිතා තමන් එක් වරක් සිරස ආයතනයට ප්‍රසංගයක් පැවැත්වීමට ලබා දුන් අතර, එහි දීද පිට්ටනිය මඩ වූ අතර, නැවත ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත් කළ බව ද පසුගිය දින සිදු වූයේ ද එවැනි තත්ත්වයක් බැවින් සාධාරණ මුදලක් අය කරගෙන ඉතිරි මුදල් නිදහස් කරන ලෙස ද පිට්ටනිය ඉදිරියට ලබා නොදෙන්නේ නම් අතුරු ව්‍යවස්ථාවක් සකස් කර කිසිදු අයෙකුට ලබා නොදෙන ලෙස කටයුතු සිදු කරන ලෙසද පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසූයේ ක්‍රීඩා පිට්ටනිය සම්බන්ධ නඩුවට විශාල මුදලක් සභාව විසින් දරන බැවින් මෙවැනි ප්‍රසංගවලින් ලබා ගන්නා වූ මුදල් එම නඩුවට යෙදවීමට හැකි බවයි.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් මේ සඳහා සමාජ මාධ්‍ය හරහා විශාල චෝදනා පැමිණි අතර, තමන් විසින් යම් උසිගැන්වීමක් කරන බවට චෝදනාවක් කර ඇති බව ද මාර්ග සංවර්ධනයකට හෝ සභාවේ මුදල් නොමැති බැවින් හා සභාවට ආදායමක් ලැබෙන බැවින් ක්‍රීඩා පිටිය සංගීත සැණකෙළිය සඳහා ලබා දීමට කැමැත්ත පළ කළ බව ද ගිවිසුම් කොන්දේසි උල්ලංඝනය වීමක් අවසාන දින දෙකෙහි සිදු වූ අතර, එම නිසා පිට්ටනියට යම් අලාභහානියක් සිදු වූ බව ද මෙයින් ලබා ගත් මුදලින් ක්‍රීඩා පිටියෙහි ක්‍රීඩාගාරය අලුත්වැඩියා කර අසල කැලේ කොටස සුද්ධ කරන ලෙසද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය පැවසූයේ ජනතාව විශාල වශයෙන් මෙම කාලය තුල සතුටින් ගත කළ අතර, ස්වභාව ධර්මය නිසා යම් ගැටලුවක් ඇති වුව ද මේ වන විට පිට්ටනිය යථා තත්ත්වයට පත්ව ඇති බවයි.

ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් පිට්ටනිය ආරක්ෂා කර ගනිමින් සභාවට ආදායමක් ලබා ගැනීම සඳහා තීරණ ගත් අතර, පිට්ටනිය නැවතත් තිබූ තත්ත්වයට වඩා හොඳ තත්ත්වයකට පත්ව ඇති බව ද තවදුරටත් පවතින්නා වූ අඩුපාඩු පෙන්වා දෙන ලෙස ගරු නාගරික මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින බව ද සියලුම අඩුපාඩු සකස් කර ගත් පසු මුදල් නිදහස් කිරිම සුදුසු වන අතර, ජනතාව එම දින 10 තුල විනෝදයෙන් ගත කළ බව ද ක්‍රීඩාව වෙනුවෙන් වූ අපහසුතාවයට ගැන කණගාටු බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් පිට්ටනියට සිදු වූ විනාශය පළමුවෙන්ම සමාජ මාධ්‍ය හරහා පළ කළේ තමන් බව ද තමන් සභාපතිව සිටි කාලයේ දී ක්‍රීඩාව හැර කිසිදු කටයුත්තකට ක්‍රීඩා පිටිය ලබා නොදීමට සභා තීරණයක් ගත් අතර, කුණු ගොඩක් උඩ පිට්ටනිය සකස් කර ඇති බැවින් හිටපු ගරු සභාපතිතුමා ද පිට්ටනිය ආරක්ෂා වන පරිදි කටයුතු කළ බව ද ජනතාවගේ සතුට නැති කිරීමට තමන්ට අවශ්‍ය නොවන අතර, මෙවැනි කටයුතු සඳහා ලබා දීමට පොළ තනි මහලකට සකස් කිරීමේ යෝජනාවක් ගෙන ආ නමුත් වත්මන් සභාපතිවරයා එයට විරුද්ධ වූ බව ද සිදු වූ හානිය මුදලින් සාධාරණීයකරණය කිරීමට දැඩි උත්සාහයක් ගන්නා නමුත් සිදු වූ හානිය මුදලින් ගණනය කළ නොහැකි බව ද පැවසීය.

එමෙන්ම පිට්ටනිය ලබා දීම වෙනුවෙන් රු.ලක්ෂ 25 ක මුදලක් ගැනීම සැණකෙළිය සඳහා ලබා දෙන අවස්ථාවේ ලබා නොගත් නමුත් ගරු සභාපතිතුමා වෙත මුදලක් ලබා දීමට පැමිණි පසු එය ප්‍රතික්ෂේප කර වැඩි මුදලක් ඉල්ලා ඇති බව ද කෙසේ හෝ මෙම සැණකෙළිය ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කළේ මුදලක් ලැබීම නිසා බවට සැකයක් පවතින බව ද ආයතනයේ නිළධාරීන් හැසිරිය යුත්තේ නිළධාරීන් වශයෙන් බව ද පිට්ටනිය යථා තත්ත්වයට පත්වීමට මාස ගණනාවක් ගත වන බැවින් ඒ වනතුරු මුදල් නිදහස් නොකරන ලෙස ද ගරු නාගරික මන්ත්‍රීවරු කණ්ඩායමක් සමඟ නිළධාරීන් ඇතුලත් කර කමිටුවක් පත් කර අධීක්ෂණය කර රැඳවුම් මුදල් නිදහස් කරන ලෙස ද වැඩිදුරටත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ ජනතාවට හැමදේකටම පවතින්නේ මෙම පිට්ටනිය පමණක් බැවින් එම දේ ජනතාවගේ පැත්තෙන් සාධාරණ බව ද එම නිසා කමිටුවක් හෝ පත් කර අධීක්ෂණයෙන් පසු රැඳවුම් මුදල් නිදහස් කරන ලෙස ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් තමන් ක්‍රීඩා පිටිය සංගීත සැණකෙළිය සඳහා ලබා දීමට මුලදී විරුද්ධ වූ නමුත් සභාවේ ආදායම් තත්ත්වය හා මිනිසුන්ගේ පීඩාකාරී තත්ත්වය සලකා කැමැත්ත ලබා දුන් අතර, මේ වන විට විනාශ වී ගිය පිට්ටනිය යථා තත්ත්වය පත්වෙමින් පවතින බව ද අඩුපාඩු සකස් කර ගනිමින් අතුරු ව්‍යවස්ථාවක් මඟින් හෝ ඉදිරියට ක්‍රීඩා පිටිය සංවර්ධනය කර ගැනීමට කටයුතු කිරීම සුදුසු බව ද පවසන ලදී.

මේ සම්බන්ධව අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, තමන් පාපන්දු සම්මේලනයේ උප සභාපති වශයෙන් ක්‍රීඩා පිටිය ලබා දීමේ යෝජනාවෙහි දී ඡන්දයෙන් වැළකී සිටි අතර, සිදු වූ අඩුපාඩු නොව විකල්පය ගැන සිතිය යුතු බව ද පිට්ටනිය වටා කාණුව සකස් කළ යුතු අතර, රැඳවුම් මුදල් නිදහස් නොකරන ලෙසද පිට්ටනියේ අපට අයිති ඉතුරු කොටසේ පස් ඉවත් කළ අතර, එය මට්ටම් කිරීම සිදු කරන ලෙස ද පැවසීය.

මේ සම්බන්ධව කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.

අදාල කරුණු පැහැදිලි කරගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

ඒ අනුව නව ගිවිසුම ප්‍රකාරව කටයුතු නිම කිරීම පිළිබඳව වැඩ අධිකාරීතුමාගේ නිර්දේශය ලබා ගැනීමෙන් අනතුරුව එකී නිර්දේශය සභාවේ ගරු නාගරික මන්ත්‍රී/මන්ත්‍රීවරියන් සියලුම දෙනාගෙන් යුක්ත කමිටුවකින් සාකච්ඡා කර තැන්පත් මුදල නිදහස් කිරීම සම්බන්ධ තීරණයක් ගැනීම සුදුසු බවට ද එම තීරණය සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ද ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**ගරු ආණ්ඩුකාරතුමාගේ රැස්වීමක් සඳහා සහභාගී වීම වෙනුවෙන් ගරු සභාපතිතුමා විසින් ගරු උප සභාපතිතුමාට මූලාසනය භාර දී ප.ව. 12.55 ට පමණ සභා ශාලාවෙන් පිටවන ලදී.**

06:01:19 බළන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටියේ ක්‍රිකට් තරඟාවලියක් පැවැත්වීම සඳහා එස්.චන්ද්‍රමෝහන් යන අය 2022-09-29 දින නගර සභාව වෙත රු. 5,000.00 ක මුදලක් ගෙවූ නමුත් එම තරඟය නොපැවැත්වීම හේතුවෙන් එම රු.5,000.00 ක මුදල ආපසු එස්.චන්ද්‍රමෝහන් යන අය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**ප.ව. 1:00 ට ගරු නාගරික මන්ත්‍රී එස්.ජී.ජෝර්ජ් මැතිතුමා සභාවෙන් පිටවන ලදී.**
**ප.ව. 1:05 ට ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා සභාවෙන් පිටවන ලදී.**

06:01:20 ලීටර් 4000 ගලි බවුසරයේ සේවය ලබා දීම වෙනුවෙන් මිල ගණන් තීරණය කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- නගර සීමාවේ නිවාස/ආගමික ස්ථාන/පුණ්‍ය ස්ථාන/පාසල් සහ රජයේ ස්ථාන සඳහා රු.16,500.00
- නගර සීමාවේ ව්‍යාපාරික ස්ථාන සඳහා රු. 20,000.00
- නගර සීමාවෙන් පිටත නිවාස/ආගමික ස්ථාන/පුණ්‍ය ස්ථාන/පාසල් සහ රජයේ ස්ථාන සඳහා රු. 20,000.00
- නගර සීමාවෙන් පිටත ව්‍යාපාරික ස්ථාන සඳහා - රු. 24,000.00

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:21 බළන්ගොඩ නගර සභාව සතු මහජන පොළ ආපන ශාලාව ටෙන්ඩර් කිරීම වෙනුවෙන් අවම ලංසු මුදල තීරණය කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ජී.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු උප සභාපතිතුමා පැවසූයේ මහජන පොළ ආපන ශාලාව සඳහා නව තක්සේරු මුදල රු. 15,000.00 ක් වන බවයි.

ඒ අනුව නව තක්සේරු මුදල වන රු. 15,000.00 ක මුදල අවම ලංසු මුදල වශයෙන් ගෙන මහජන පොළ ආපන ශාලාව ප්‍රාදේශීය ටෙන්ඩර් ක්‍රමවේදය අනුව ටෙන්ඩර් කිරීම සුදුසු බවට ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:22 2023 ජනවාරි මස 01 වන දින සිට 2023 දෙසැම්බර් මස 31 දින දක්වා වූ කාලය සඳහා දන්වීම් පුවරු 10 ටෙන්ඩර් කිරීම, අවම ලංසු මුදල තීරණය කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව වර්තමාන මාසික ටෙන්ඩර් මුදල වන රු.31,250.00 ක මුදලට 20% ක් වැඩි කර මාසික අවම ලංසු මුදල වශයෙන් රු.37,500.00 ක මුදල ගෙන ටෙන්ඩර් දන්වීම් පුවරු 10 අලුත්වැඩියා කිරීමෙන් අනතුරුව ටෙන්ඩර් කිරීම සුදුසු බවට ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:23 බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගෙවතු වගාව සඳහා කොම්පෝස්ට් පොහොර කි.ග්‍රෑම් 200 ක් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. මන්ත්‍රී යෝජනා**

07:01 **ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

07:01:01 කසළ එකතු කිරීමේ ටෙන්ඩර්කරුට ගිවිසුම් කොන්දේසි ලබා දීමේ දී අයාලේ යන සුනඛයින් සහ ගවයින් මිය ගිය විට එම මෘත දේහ මිහිදන් කිරීමට කොන්දේසි ඇතුලත් කිරීම

07:01:02 අඩු ආදායම්ලාභීන් සඳහා ලබා දීමට යෝජිත වැසිකිළි ආධාරය වැවවත්ත වතු නිවාසවල පොදු වැසිකිළියක් ඉදි කිරීම සඳහා ලබා දීමට යෝජනා කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් කසළ එකතු කිරීමේ ගිවිසුම සඳහා අයාලේ යන සුනඛයින් සහ ගවයින් මිය ගිය විට එම මෘත දේහ මිහිදන් කිරීම සිදු කළ යුතු බවට කොන්දේසියක් ඇතුලත් කරන ලෙසද වැවවත්ත වතු නිවාසවලට පොදු වැසිකිළියක් නොමැති නිසා අඩු ආදායම්ලාභීන් සඳහා ලබා දීමට යෝජිත වැසිකිළි ආධාරය ඒ සඳහා ලබා දීමට යෝජනා කරන බව ද පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:02 **ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය**

07:02:01 කොළඹ සිට ධාවනය වන දුර සේවා බස් රථ සඳහා නගරය වටා ගමන් කිරීම වෙනුවට බස් නැවතුම්පළ අසලින් ධාවනය කිරීමට සැලැස්වීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය, දැනට කොළඹ සිට පැමිණෙන දුර ගමන් සේවා බස් රථ ෆුඩ් සිටි හා මහජන බැංකුව අසල පමණක් නවත්වන බැවින් රාත්‍රි කාලයේ දී මගීන්ට එම ස්ථානයන්හි සිට බළන්ගොඩ බස්නැවතුම්පොළ දක්වා ගමන් කිරීමට සිදුවන අතර, ඇතැම් විට ඒ සඳහා ත්‍රි රෝද රථ භාවිත කරන බව ද බස් රථයක් වෙත යාමේ දී ප්‍රමාද වීම් සිදු වීම නිසා මගීන් අපහසුතාවයට ලක් වන බවද පැවසීය. එම නිසා කොළඹ සිට පැමිණෙන දුර ගමන් සේවා බස් රථ මගීන්ගේ පහසුව පිළිබඳව සලකා බළන්ගොඩ බස් නැවතුම්පළ අසලින් ධාවනය කිරීමට සැලැස්වීම සුදුසු බව ද පවසන ලදී.

ගරු උප සභාපතිතුමා පැවසූයේ රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට මෙම යෝජනාව ඉදිරිපත් කර සාකච්ඡා කිරීම සුදුසු බවයි.

07:03 **ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

07:03:01 බළන්ගොඩ නගර සභාව සම්බන්ධ වන මාර්ග සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය ඇතුළු ආයතන සමඟ ගරු නාගරික මන්ත්‍රීවරුන් සම්බන්ධ වන පරිදි වැඩමුළුවක් සංවිධානය කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් යම් කිසි යෝජනාවක් සඳහා සභා තීරණ ගනු ලැබුවත් අනිකුත් ආයතන වෙත යොමු කිරීමට සිදු වන බව ද එම ආයතන සමඟ එක්ව ක්‍රමවේදයක් හරහා කටයුතු කිරීම මඟින් පහසුවක් ඇති වන බව පළාත් පාලන සංසදයේ පැවති වැඩමුළුවේ දී පැවසූ අතර, එම ක්‍රමවේදය හැකි ඉක්මනින් ක්‍රියාත්මක කිරීමට බළන්ගොඩ නගර සභාව සම්බන්ධ වන මාර්ග සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය ඇතුළු ආයතන සමඟ ගරු නාගරික මන්ත්‍රීවරුන් සම්බන්ධ වන පරිදි වැඩමුළුවක් සංවිධානය කරන ලෙස පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**08:01 2022-10-05 දිනැති කර්මාන්ත කමිටු වාර්තාව**

02. සංවර්ධන කටයුතු සඳහා ලබා දෙන මන්ත්‍රී යෝජනා වෙනුවෙන් නිර්දේශ ලබා දීම

2:01 ගරු නාගරික මන්ත්‍රී ඊ.ජී.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා - 02:01:01 යෝජනාව

2:02 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා - 02:02:01 යෝජනාව

2:03 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා -02:03:01 සිට 02:03:02 යෝජනා

2:04 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා -02:04:01 සිට02:04:08 යෝජනා

2:05 ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා - 02:05:01 යෝජනාව

වෙනත් කරුණු

01. ක්‍රීඩා පිටිය කඩිනමින් පිළිසකර කරන ලෙස ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා කරන ලද ඉල්ලීම

02. තුරු උයන භෝජනාගාරය ඉදි කිරීමේ වස්තු විද්‍යාඥ සැලසුම් සකස් කිරීම සඳහා නිර්දේශය ලබා දීම

ඉහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා යන්ත්‍ර, සේවකයන් හා රථ වාහන ලබා ගැනීම සඳහාත් 2022 ඔක්තෝම්බර් මස කර්මාන්ත අංශය මඟින් සිදු කිරීමට අපේක්ෂිත කර්මාන්ත හා නඩත්තු කටයුතු සිදු කිරීම සඳහාත් නිර්දේශ ලබා දීම

**08:02 2022-09-16 දිනැති මුදල් කමිටු වාර්තාව**

01. අංක 6227 ට්‍රැක්ටරය අලුත් වැඩියා කිරීම ඇස්තමේන්තු අනුමත කිරීම.
02. සභාව සතුව ගබඩාවේ පවතින ටයර් නැවත පිරවීම (රීබිල් කිරීම) සඳහා මිල ගණන් විවෘත කිරීම.
03. අංක 46-4907 අංක දරන ට්‍රේලරයේ සම්පූර්ණ අලුත්වැඩියාවක් සිදු කිරීම
04. බස් නැවතුම්පල ස්ථානයේ ඇති වතුර ටැංකිය සඳහා පැවති වහලේ කැඩී ගිය කොටස අලුත්වැඩියා කිරීම සඳහා වන මිල ගණන් විවෘත කිරීම

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද කාරක සභා වාර්තාවල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**09. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

**2022-09-01 සිට 2022-09-31 දක්වා ආදායම් හා වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 10,974,223.17 |
| වෙනත් ලැබීම් | 2,271,487.67 |
| මුළු ලැබීම් | 13,245,710.84 |
| පුනරාවර්තන වියදම් | 11,196,378.95 |
| වෙනත් වියදම් | 4,015,883.44 |
| මුළු වියදම් | 15,212,262.39 |

2022-09-01 සිට 2022-09-31 දක්වා ඉන්ධන වාර්තාව

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| RD-8000 | 47,300.00 |
| 56-1906 | 49,450.00 |
| 227-5020 | 101,660.00 |
| GK - 6227 | 8,600.00 |
| VI-1833 | 2,700.00 |
| 226-7521 | 30,100.00 |
| BC-0005 | 90,300.00 |
| GC -0001 | 7,200.00 |
| LL - 7688 | 58,050.00 |
| HF - 8952 | 4,300.00 |
| JD-4684 | 5,400.00 |
| ND-5124 | 81,700.00 |
| PF-4006 | 152,650.00 |
| QL-2901 | 15,750.00 |
| FP- 0002 | 8,600.00 |
| RC 1118 | 70,950.00 |
| GK 1483 | 47,300.00 |
| ZA 5039 | 133,875.00 |
| ZA 5039 | 107,480.00 |
| LL 2110 | 30,550.00 |
| UQ -1933 | 7,200.00 |
| RD - 8240 | 79,550.00 |
| ZA - 9835 | 8,600.00 |
| RE - 2600 | 83,850.00 |
| ZA - 0228 | 17,200.00 |
| HF 7899 | 123,470.00 |
| RC - 1118 | 70,950.00 |
| RC- 1107 | 8,600.00 |
| RB 4786 | 92,450.00 |
| එකතුව | **1,545,785.00** |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**10. ඇස්තමේන්තු අනුමත කිරීම**

**10:01 ගරු සභාපති ඩබ්.ඒ.ඩබ්.පී. වසන්ත ගුණරත්න මැතිතුමා**

10:01:01 කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිති ශාලාවේ පවත්වාගෙන යන සෞඛ්‍ය මධ්‍යස්ථානයට ජල සැපයුම ලබා ගැනීම සඳහා වන ඇස්තමේන්තුව - රු.24,292.50

ඉහත සඳහන් ඇස්තමේන්තු යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**ප.ව. 1:41 ට ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. ජේමදාස මැතිතුමා සභාවෙන් පිටවන ලදී.**

**11. පෞද්ගලික මන්ත්‍රි පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය අදහස් දක්වමින් කුමාරගමට බස් රථයක් යොදා ඇති අතර පාර දෙපස සුද්ධ නොකිරීම නිසා පාසල් දරුවන්ට යම් අවදානමක් පවතින බැවින් එය සුද්ධ කරන ලෙස ද මාර්ගයේ තවදුරටත් අඩුපාඩු කිහිපයක් පවතින බැවින් එය ඉටු කර දෙන ලෙසද මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ හිමිවූ රුපියල් ලක්ෂ 10 න් ලක්ෂ දෙක හමාරක් වැයකොට තිබ්බටුකැටියවත්ත පාර

සංවර්ධනය කල නමුත් එය වාර්තා වී නොමැති බව ද ඉතිරි මුදලින් සංවර්ධන කටයුතු සිදු කිරීමට නොහැකි වූයේ රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් බව ද කැකුලු පෙර පාසලට ක්‍රීඩා භාණ්ඩ ලබා දිම සම්බන්ධව ස්තුතිවන්ත වන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් මිනිසුන්ට විනෝද වීමට සංගීත ප්‍රසංගය අවශ්‍ය නමුත් බළන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටිය දරුවන් වෙනුවෙන් සුරක්ෂිත විය යුතුය යන මතයේ තමන් සිටින බව ද පසුගිය දිනක සභාවේ පවතින ජේසීබී යන්ත්‍රය ලබා දී පන්සලේ වැඩ කටයුතු විධිමත්ව ඉටු කර ගැනීමට හැකි වූ අතර, ඒ සම්බන්ධව කර්මාන්ත කමිටු සභාපතිතුමා ඇතුලු සියලුම දෙනාට ස්තුතිවන්ත වන බව ද පළාත් පාලන සංසදය විසින් පැවැත් වූ වැඩසටහන සඳහා තමන් සහභාගී වූ අතර, එම වැඩසටහන හරහා විශාල දැනුම් සම්භාරයක් ලබා ගැනීමට හැකි වූ බව ද ඒ සඳහා අවස්ථාව සලසා දුන් සියලු දෙනාට ස්තුතිවන්ත වන බව ද පවසන ලදී.

එමෙන්ම මන්ත්‍රී ප්‍රතිපාදන වශයෙන් රුපියල් ලක්ෂ 10 ක මුදලක් වෙන් වූ නමුත් රටේ පැවති තත්ත්වය මත එම මුදලින් සංවර්ධන කටයුතු ඉටු කර ගැනීමට නොහැකි වූ බවද ඒ සම්බන්ධව සම්බන්ධීකරණ කමිටුවේ දී තමන් විසින් කරන ලද පැහැදිලි කිරීම මත ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා විසින් ගරු ආණ්ඩුකාරතුමාට දුරකතනයෙන් අමතා අවශ්‍ය අනුමැතිය ලබා දීමට කටයුතු කල බව ද සිදු කිරීමට නොහැකි වූ එම සංවර්ධන කටයුතු ඉටු කර ගැනීමට අවස්ථාව සලසා දෙන ලෙසද වැසිකිළි ආධාර ලබා දීම කඩිනමින් ඉටු කිරීමට අවස්ථාව සලසා දෙන ලෙසද තමන් පොදුවේ සියලුම දෙනා ගැන සිතා හෘද සාක්ෂියට අනුව නිවැරදි දේ වෙනුවන් පෙනී සිටින බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී එම්. ශාන්තිලේඛා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී එම්. ශාන්තිලේඛා මැතිතුමිය අදහස් දක්වමින් කුමාරගමට බස් රථයක් ලබා දීම ඉතාම හොඳ දෙයක් වන අතර, පන්සල අසලින් එම බස් රථය හැරවීමේ දී යම් අවදානමක් පවතින බැවින් පැති බැම්මක් හෝ යම් සුදුසු ප්‍රතිසංස්කරණයක් සිදු කරන ලෙසද සභාව මගින් ලබා දුන් බීජ හා පොහොර අවශ්‍ය අයට ලබා දුන් අතර, ඒ සම්බන්ධව ස්තුතිවන්ත වන බව ද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් පළාත් පාලන සංසදය විසින් පැවැත් වූ වැඩසටහනට තමන් ද සහභාගී වූ අතර, ඉන් විශාල දැනුමක් ලබා ගත් බව ද එහි දී බළන්ගොඩ නගර සභාව ශ්‍රී ලංකාවේ හොඳම නගර සභාව වන නමුත් ඉදිරියේ දී කසළ ප්‍රශ්නයකට මුහුණපෑමට සිදු වන බව තමන් විසින් කළ කරුණු දැක්වීම අනුව ඔවුන් ගරු සභාපතිතුමා හට දුරකතනයෙන් ඇමතු බව ද ඉදිරි දිනක බළන්ගොඩ නගර සභාවට පැමිණ ඒ සඳහා විසඳුමක් ලබා දීමට අපේක්ෂා කරන බව පැවසූ බව ද මෙවැනි වැඩසටහන් සඳහා ගරු සභාපතිතුමා,ලේකම්තුමා හා විෂය නිළධාරීන් සහභාගී විය යුතු බව ද ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම බළන්ගොඩ බස් නැවතුම්පළ බුලත් විට කෙළ ගසන්නන් නිසා විනාශ වී ඇති අතර, විශේෂයෙන් බුලත් විට කෑමට හුරු වී ඇති පාසල් ළමුන් මෙම ස්ථාන අපවිත්‍ර කරන බවට ආරංචි ලැබී ඇති බැවින්

පාසල් මට්ටමින් දැනුවත් කිරීම් සිදු කිරීම ඇතුලු වෙනත් විවිධ ක්‍රමවේද ඔස්සේ මෙම ස්ථාන පිරිසිදුව පවත්වාගෙන යාම සිදු කළ හැකි බැවින් ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙසද පරවියන් ඇතුලු වීම වැළැක්වීම සඳහා දැල් ආවරණ යෙදීම තවමත් සිදු වී නොමැති බව ද සාංඝිකාරාමයේ කාණු පද්ධතියේ වැඩ කටයුතු අවසන් වෙමින් පවතින නමුත් හාමුදුරුවන් පොරොන්දු වූ පරිදි මගී නැවතුම්පල තවම ලැබී නොමැති නිසා පාසල් දරුවන් දැඩි අවදානමකට ලක්ව ඇති බවද තමන් බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති රැස්වීමේ දී නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම සුද්ධ කර මිනිසුන්ට ආදායම් ඉපයීමට හැකි පරිදි සකස් කිරීම සුදුසු බවට යෝජනාවක් කළ අතර,ඒ පිළිබඳව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාගේ ප්‍රශංසාව හිමි වූ බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

වැසිකිළි ආධාර ලබා දීම සඳහා සභාවේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ගණකාධිකාරීතුමාගෙන් කරුණු විමසා බැලීම සඳහා ගරු උප සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමියගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.

අදාල කරුණු පැහැදිලි කරගැනීමෙන් අනතුරුව ගරු උප සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

**ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් පළාත් පාලන සංසදය විසින් පැවැත්වූ වැඩසටහන ඉතා වටිනා බව ද එය පරිපාලනය සම්බන්ධව පැවැත්වූවක් බැවින් ලේකම්තුමා සහභාගී වූවා නම් වටිනාකම වැඩි බව ද අනිකුත් පළාත් පාලන ආයතන සමඟ සැසඳීමේ දී අපගේ නගර සභාව බොහෝ ඉදිරියෙන් සිටින බව ද අතුරු මාර්ගවල නාම පුවරු සවි කිරීමේ වර්තමාන තත්ත්වය ගැන සොයා බලන ලෙසද මස්සැන්න මාර්ගය මාර්ග සංවර්ධන අධිකාරියෙන් සුද්ධ නොකරන බැවින් ඒ සම්බන්ධව සොයා බලන ලෙසද ඕලුගංතොට පීසා හට් එක අසල ස්ලැබ් කැට ඇත් වී අවදානම් සහිත තත්ත්වයක් උද්ගත වී ඇති අතර එය සකස් කරන ලෙසද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ප.ව. 2:06 ට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා සභාවෙන් පිටවන ලදී.**

**ප.ව. 2:06 ට ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා සභාවෙන් පිටවන ලදී.**

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් සභාවට පැමිණි නව මාධ්‍යවේදි මහතා සාදරයෙන් පිළිගන්නා බවද තානායම් පිවිසුම් පාරේ මැණික් ව්‍යාපාරිකයන් සිටින ස්ථානය අසල කම්බිය ඉවත් කළ පසු හිඩැසක් පවතින අතර, පිටපලු ලෑලි යොදා ඇති බව ද මෙවැනි කුඩා කටයුත්තක් ඉටු කර ගැනීමට නොහැකි වීම ලැජ්ජාවට කරුණක් බව ද ගරු සභාපතිතුමා සභාවේ ආදායම ඉහල මට්ටමක පවතින බව පැවසූ නමුත් දැඩි ආර්ථික දුෂ්කරතාවයකින් සභාව ගෙන යන බව පැහැදිලි වූ බව ද බුහාරි හෝටලය අසල කොන්ක්‍රීට් තහඩුව මේ වන තෙක් යොදා නැති අතර, ගිනි නිවීමේ කටයුතු සඳහා යොදා ගැනීමට ජල කරාම 06 ක් සවි කරන ලෙස සිදු කළ ඉල්ලීම් තවමත් ඉටු කර නැති බව ද සේනක පෙදෙසේ පවතින ගස් දෙකක් ගැන අවුරුදු 02 ක සිට පවසන නමුත් එය ඉටු කර නොමැති බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් අද දින සභාවේ දී ඡන්ද විමසීම් දෙකක් පැවති අතර, එහි දී තමන් කටයුතු කලේ හරි දේ වෙනුවෙන් බැවින් ඒ ගැන කණගාටු නොවන බව ද නවක මාධ්‍යවේදී මහතා සාදරයෙන් පිළිගන්නා බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**12. අවසානය**

ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් සියලු දෙනාට ස්තුතිය පළ කරමින් මෙදින මහ සභාවේ වැඩ කටයුතු ප.ව.02.16ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.ඒ.වසන්ත ගුණරත්න,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.